# ගම නැගුම වැඩසටහන

## පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය

# කඩුවනත්ත ජනපදය

රත්නපුර දිස්ත්‍රික්කය

ඩබ්.එච්. දුමින්ද ප්‍රියදර්ශන

2007 අගෝස්තු

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07

711.3
(SL)
හෙක්ට

2009|06 2010|04

200/=

## - ස්තුතිය -

වර්තමාන රජය විසින් මහින්ද චින්තන වැඩසටහන යටතේ දිවයින පුරා නොදියුණු ගම්මාන සංවර්ධනය කිරීමේ "ගම නැගුම" වැඩසටහනේ මූලික පියවරක් ලෙස ගම්මාන දහයක් සංවර්ධනය කිරීමට පියවර ගැණින. මෙම ගම නැගුම වැඩසටහන යටතේ අදාළ ව්‍යාපෘති සිදු කිරීමෙන් පසු ඒවා ඇගයීමට පූර්ව සමාජ ආර්ථික සමීක්ෂණයක් කළ යුතු විය. මෙම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුවනත්ත හේන්යාය ගම්මානයේ සිදු කිරීමට අවශ්‍ය සියළු ආයතනමය පහසුකම් ලබා දුන් අප ආයතනයේ අධ්‍යක්ෂ වී.කේ. නානායක්කාර මහතාට සහ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්.ජී. ජයසේන මහතාටත් විශේෂ ස්තුතිය පුද කරමි. එසේම,

- සමස්ථ සමීක්ෂණය සම්බන්ධීකරණය කරමින් නිරන්තර අවශ්‍ය උපදෙස් ලබාදෙමින් අපව දිරිමත් කළ කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශයේ අංශ ප්‍රධාන ජේ.කේ.එම්.ඩී. චන්ද්‍රසිරි මහතාට,

- ක්ෂේත්‍ර සමීක්ෂණයේ සියලු කටයුතුවල වගකීම දරමින් එය සාර්ථකව නිම කිරීමට නිරන්තර කැපකිරීම් කළ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී එන්.එන්.ජේ. ද සිල්වා මහතාට,

- සමීක්ෂණයේ දත්ත සැකසුම් කළ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශ්ලේෂක එම්.එල්.ඩී. සෙනරත් මහතා ඇතුළු කාර්ය මණ්ඩලයට,

- විවිධාකාරයෙන් සහාය දැක්වූ සංඛ්‍යාන නිලධාරිණී සන්ධ්‍යා සේනානායක මහත්මියට,

- ක්ෂේත්‍ර සමීක්ෂණය හා ද්විතීයික දත්ත ලබාගැනීමේදී ඉතා සුහදව අවශ්‍ය තොරතුරු සපයා දුන් ඇලපාත ප්‍රාදේශීය ලේකම් ඉන්ද්‍රා දිසානායක මහත්මිය ඇතුළු කාර්ය මණ්ඩලයට,

- ක්ෂේත්‍ර සමීක්ෂණයේදී විමර්ශකයින් ලෙස කටයුතු කළ කඩුවනත්ත හේන්යාය ගම්මානයේ ටී.පී. ඉදුනිල් කරුණාරත්න මහතා සහ එම්.යූ.අයි. රේණුකා ජයලත් මෙනෙවියට,

- තොරතුරු ලබාදුන් සියලු ගම්වාසීන්ට,

- වාර්තාව පරිගණකගත කළ රාජිකා ශ්‍යාමලී මෙනෙවියට හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට

ස්තුතිය පුදකර සිටිමි.

ඩබ්.එච්.දුමින්ද ප්‍රියදර්ශන
පර්යේෂණ නිලධාරි

MFN 8860



21450
21450
පුස්තකාලය
LIBRARY

# පටුන


පිටු අංකය

ස්තුතිය i

පටුන ii-ix

**පළමු පරිච්ඡේදය** 01-05

1.1 ගම නැගුම වැඩසටහන 01

❖ මූලික අදහස, දැක්ම හා මෙහෙවර

❖ අරමුණු

1.2 ගම නැගුම ආදර්ශ ගම්මාන වැඩසටහන 01

1.3 පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යයනය 02

1.4 අධ්‍යයනයෙහි අරමුණු 02

1.5 පර්යේෂණ ක්‍රමවේදය 03

1.6 අධ්‍යයන කාලය 03

❖ තොරතුරු ගත් කාල සීමාව හා වාර්ෂික තොරතුරු රැස් කිරීමේදී අවධානයට යොමු වූ කාල සීමාව (2005 යල හා 2005/2006 මහ)

1.7 ගැටලු සහ සීමා 04-05

**දෙවන පරිච්ඡේදය** 06-09

**අධ්‍යයන ග්‍රාමීය හා ජනගහන තොරතුරු**

1. පිහිටීම 06
2. දේශගුණික තත්ත්වය 06
3. ඓතිහාසික තත්ත්වය හා ජනාවාසවීම 07
4. ජනගහනය 07

5. අධ්‍යාපන තත්ත්වය 08-09

❖ වැඩිහිටි සාක්ෂරතාව (ස්ත්‍රී/පුරුෂ වශයෙන්

❖ අධ්‍යාපන මට්ටම්

## තුන්වන පරිච්ඡේදය 10-20

### ආර්ථික කටයුතු, රැකියාවන්හි ස්වභාවය හා ආදායම


3.1 සේවා නියුක්තිය 10

❖ 16-55 අතර ජනගහනයේ (ශ්‍රම බලකායෙහි) සේවා නියුක්තිකයන් ප්‍රතිශතය

❖ සේවා වියුක්තිය

3.2 ආර්ථික කටයුතු හා ආදායම් මාර්ග 10

❖ වැඩි පිරිසකගේ ප්‍රධාන ආර්ථික කටයුතු හෝ කටයුත්ත

❖ අනෙකුත් ආදායම් මාර්ග (උදා : කෘෂි උපකරණ කුලියට දීම)

3.3 ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වභාවය 10

❖ ප්‍රධාන හා ද්විතීයික රැකියාවල නියැලීම (ප්‍රතිශත)

❖ වැඩි ජනතාවක් යෙදී ඇති රැකියා (උදා : ගොවිතැන, සත්ත්ව පාලනය, කෘෂි කම්කරු) (දැනට රැස්කර ඇති තොරතුරු අනුව විවිධ රැකියා ගණන)

❖ ආරක්ෂක හමුදාවන්හි සේවය හා විදේශ රැකියාවන්ට ප්‍රතිශතය

❖ වැටුප් ලබන රැකියාවල තත්ත්වය (ස්ථිර, තාවකාලික, අර්ධ කාලීන)

3.4 ආදායම 12

❖ දළ වාර්ෂික ආදායම් මට්ටම අනුව පවුල් වල ප්‍රතිශතය

❖ ආදායමෙහි සංයුතිය (වාර්ෂික ආදායමට විවිධ මාර්ග වලින් ලැබෙන ආදායම් මගින් කරන දායකත්වය) 07

3.5.1 දුප්පත්කම 13

❖ දුප්පත්කමේ නිර්නායක අනුව දුප්පත් පවුල් වල ප්‍රතිශතය (ගමෙන් ගත් තොරතුරු අනුව සමෘද්ධි ලාභී පවුල් ගණන)

3.5.2 දුප්පත්කමේ ස්වභාවය හා එයට බලපා ඇති හේතූන් 15

3.6 ඉතිරි කිරීම් 16

❖ විධිමත් ක්‍රම ඔස්සේ ඉතිරි කිරීමට ඇති පෙළඹුම (බැංකු ආයතනවල ගිණුම් ඇති පවුල් වල ප්‍රතිශතය හා ඉතුරුම් ප්‍රමාණය)

❖ අවිධිමත් ක්‍රම (සීට්ටු වැනි) ඔස්සේ ඉතිරි කිරීමට ඇති පෙළඹීම (එවැනි පවුල් වල ප්‍රතිශතය) හා ඉතුරුම් ප්‍රමාණය)

❖ ඉතිරි කර ඇති මුළු ප්‍රමාණය

3.7 ණය ගැති භාවය 18-20

❖ ණය ගැති භාවයෙන් පෙළෙන පවුල් (මුළු ප්‍රමාණය හා ණය ප්‍රමාණය අනුව ප්‍රතිශතය)

❖ ණය ලබාගත් හේතූන් හා නොගෙවීමට හේතු

❖ ණය ලබාගත් මාර්ග හා පොළී ප්‍රතිශතය/ ඒවා ඉහල පොළී මට්ටම්ද යන්න)

❖ සහනදායී පොළියට පහසුවෙන් ණය ලබාගත හැකි මාර්ග ඇති/නැති බව හෝ එවැනි ආයතන පිහිටුවා ගැනීමට හෝ ඇතිනම් ප්‍රයෝජන ගැනීමට නොපෙළඹීමට හේතු

**හතර වන පරිච්ඡේදය** 21-31

**නිවාස තත්ත්වය සහ පහසුකම්**

4.1 නිවාස අයිතිය 21

❖ සියළු දෙනාට නිවාස තිබේද/ නැද්ද යන්න හා පිහිටා ඇත්තේ කෙසේද යන්න

❖ අයිතියෙහි ස්වභාවය

4.2 නිවාස තත්ත්වය 21

❖ ස්ථිර/ තාවකාලික ඒවාද යන්න

❖ වහල, බිත්ති හා ගෙබිම අනුව තත්ත්වය (රැස්කර ඇති තොරතුරු අනුව ඒ ඒ තත්ත්වයේ නිවාස ගණන)

❖ නිවෙස් වල විශාලත්වය

❖ වෙනම කුස්සියක් ඇති/නැති බව

4.3 නිවාස වලට ඇති පහසුකම් 24

❖ මෝටර් රථයකින් නිවාස අසළට යාමට තරම් පිවිසීමේ පහසුකම් තිබේද යන්න

❖ රැහැන් දුරකථන පහසුකම් (රැස්කර ඇති තොරතුරු අනුව නිවාස ගණන)

❖ ජංගම දුරකථන පහසුකම්

4.4 බලශක්ති භාවිතය සඳහා පහසුකම් 25

❖ ආහාර පිසීම සඳහා භාවිත බලශක්ති ප්‍රභේද හා දර වැනි ඒවා පහසුවෙන් ලබාගත හැකිද යන්න

❖ පානීය ජල පහසුකම් 26

❖ පානීය ජලය ලබා ගන්නා මාර්ග (රැස්කර ඇති තොරතුරු අනුව නල ජලය ඇති නිවාස)

❖ ජලයේ පිරිසිදුබව පිළිබඳ වැසියන්ගේ අදහස්

❖ හොඳ ජලය සපයා ගැනීමට ඔවුන් කරන යෝජනා

4.5 වැසිකිළි පහසුකම් 27

- ❖ වැසිකිළි ඇති/නැති ප්‍රතිශතය (රැස්කර ඇති තොරතුරු අනුව වැසිකිළි නැති නිවාස ගණන)
- ❖ වැසිකිළි වල තත්ත්වය (වළ,ජල මුද්‍රිත ආදී ලෙස)

4.6 නිවෙස්වල ඇති ගෘහ උපකරණ හා බඩු බාහිරාදිය 28

- ❖ අත්‍යවශ්‍ය භාණ්ඩ ඇති/නැති බව හා ඒවා තිබෙන පවුල් වල ප්‍රතිශතය

4.7 ගමනාගමනය හා ප්‍රවාහනය සඳහා ඇති වාහන අයිතිය 29

- ❖ බයිසිකල්, යතුරුපැදි, කාර් යනාදිය ඇති පවුල්වල ප්‍රතිශතය (රැස්කර ඇති තොරතුරු අනුව ඒ ඒ වාහන ගණන)

4.8 කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර 29

- ❖ ට්‍රැක්ටර්, දියර ඉසින යන්ත්‍ර යනාදිය ඇති පවුල් වල ප්‍රතිශතය (රැස්කර ඇති තොරතුරු අනුව ඒ ඒ උපකරණ හා යන්ත්‍ර සූත්‍ර)

4.9 සෞඛ්‍ය තත්ත්වය 29

- ❖ බෝවන ලෙඩරෝග වැළඳීම
- ❖ ජලය උණුකර බීම වැනි යහපත් සෞඛ්‍ය පුරුදුවලට ඇති හුරුව
- ❖ අයහපත් සෞඛ්‍ය පුරුදු වලට ඇබ්බැහිවීම් (බුලත් විට කෑම, මත්පැන් බීම හා දුම් බීම)
- ❖ එවැනි අයහපත් පුරුදු මගින් සමාජයට වී ඇති බලපෑම

4.10 ගමනාගමන හා සේවා යටිතල පහසුකම් 31

- ❖ දැනට රැස්කළ තොරතුරු අනුව තාර දමන ලද බොරළු,කරත්ත ආදී පාරවල කි.මී. ප්‍රමාණය)
- ❖ ප්‍රධාන පාර, නගරවලට දුර හා බස් ධාවනය වන්නේද යන්න
- ❖ විවිධ සේවා සපයන ආයතන වලට ගමේ සිට දුර
- ❖ විදුලි රැහැන්, දුරකථන රැහැන් යනාදියෙන් ගමම ආවරණය වන්නේද යන්න
- ❖ කුඩා වැව් අමුණු යනාදිය (ප්‍රයෝජනයට ගන්නා හා නොගන්නා)
- ❖ වෙනත් ගබඩා, ගොඩනැගිලි යනාදිය

**පස්වන පරිච්ඡේදය** **33-35**

**ඉඩම් අයිතිය බුක්තිය හා සංවර්ධනය කිරීම**

5.1 බුක්තිවිඳින ඉඩම්වල ස්වභාවය හා ප්‍රමාණය 32

- ❖ ගොඩ,මඩ, හේන් ආදී ලෙස විවිධාකාර ඉඩම් බුක්තිවිඳිද්ද යන්න
- ❖ පවුලක් බුක්ති විඳින සාමාන්‍ය ඉඩම් ප්‍රමාණය, එය ගොඩ හා මඩ වශයෙන්

5.2 බුක්ති විඳින ඉඩම් වල අයිතිය හා භුක්තියෙහි ස්වභාවය 32

❖ විවිධ අයිතීන් හා භුක්තීන් යටතේ ඇති ඉඩම් ප්‍රමාණය හා ඒවා ගොඩ හා මඩ ආදී වශයෙන්. (දැනට රැස්කර ඇති තොරතුරු අනුව ගමෙහි මුළු ඉඩම් ප්‍රමාණය අයිතියේ ස්වභාවය අනුව)

5.3 ඉඩම් වල භෞතික ස්වභාවය 32

❖ තැනිතලා, කඳු, බෑවුම් සහිත ද යන්න

❖ සරු නිසරු බව හෝ පසෙහි ස්වභාවය

❖ ඛාදනයට ලක්ව ඇත්නම් කොතරම් මට්ටමකින්ද යන්න

❖ ගොඩ ඉඩම් මුළුමනින්ම සංවර්ධනය කර ඇද්ද නැද්ද යන වග, නැත්නම් ප්‍රමාණය හා හේතු

❖ මඩ ඉඩම් මුළුමනින්ම සංවර්ධනය කර ඇද්ද නැද්ද යන්න (පුරන්වීමට හැර ඇද්ද)යන්න හා එම ප්‍රමාණය, ඊට හේතු

**හයවෙනි පරිච්ඡේදය**

**කෘෂිකර්මය සත්ව පාලනය හා අනෙකුත් නිෂ්පාදන කටයුතු** 35

**හත්වන පරිච්ඡේදය** **36-38**

ප්‍රජා සංවිධාන සහ ජනතා සහභාගීත්වය

7.1 ගමෙහි ඇති ප්‍රජා සංවිධාන 36

❖ දැනට ඇති සංවිධාන, ඒවා නියෝජනය කරන පවුල් සංඛ්‍යාව හා ප්‍රතිශතය (මේ සඳහා දැනට රැස්කර ඇති තොරතුරු භාවිතා කරන්න)

7.2 සංවිධාන වල ක්‍රියාකාරී බව 36

❖ දැනට වඩාත් ක්‍රියාකාරී සංවිධාන හා ඒවායින් ඉටු කරනු ලබන කාර්යයන්

7.3 ඒවායින් කරනු ලබන සංවර්ධන කටයුතු 37

❖ පසුගිය කාලය තුළදී මේවායින් ඉටුකර ඇති විශේෂ සංවර්ධන කටයුතු

7.4 අරමුදල් ගොඩනැගීම් හා ණය දීම් 38

❖ මේවා මගින් හෝ ඒ යටතේ ඇති කුඩා කණ්ඩායම් මගින් ගොඩනගා ඇති අරමුදල්, දැනට ඒවායෙහි ඇති මුළු මුදල් ප්‍රමාණය, ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම, ලබාදෙනු ලබන ණය ප්‍රමාණයන්, පොළිය, දැනට නිකුත්කර ඇති ණය කී දෙනෙකුටද යන්න, ආපසු අයකර ගැනීමේ ප්‍රතිශතය

7.5 වෙනත් සේවාවන් සැපයීම 38

❖ මේවා සතු වෙනත් බඩු බාහිරාදිය, කෘෂි හා වෙනත් උපකරණ, ඒවා ජනතාවට භාවිතයට දෙනු ලබන ආකාරය හා මිල ගණන්

7.6 ගමෙහි සංවර්ධන කටයුතු සඳහා ප්‍රජා සංවිධාන මගින් ජනතා සහභාගීත්වය ලබා ගැනීම 38

- ❖ මෙම සංවිධාන කෙතරම් දුරට ප්‍රජාතාන්ත්‍රිකව විනිවිද භාවිතයකින් හා වගකීමකින් කටයුතු කරනවාද යන්න (ප්‍රධාන රැස්වීම්, කාරක සභා රැස්වීම් පැවැත්වීම නිසි පරිදි සිදු කිරීම හා ඒවායේ අයවැය යනාදිය විවෘතව කථා කිරීම)
- ❖ ගමෙහි සංවර්ධන කටයුතු සඳහා මේවා මගින් අනෙක් සාමාජිකයන්ගේ අදහස් කෙතරම් දුරට ලබා ගන්නවාද යන්න

7.7 වෙනත් ආකාරයන්ගෙන් ගමෙහි සංවර්ධනය සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීම 38

- ❖ ඡන්දදායකයන් පත්කරන ලද නියෝජිතයින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ගැන වරින් වර සාකච්ඡා කරනවාද යන්න

සාරාංශය 39-41

# වගු සටහන් නාමාවලිය

දෙවන පරිච්ඡේදය


2.1 සංඛ්‍යා සටහන - වයස්කාණ්ඩ අනුව ජනගහනය 07

2.1 සංඛ්‍යා සටහන - ගෘහ මූලිකයින්ගේ අධ්‍යාපන මට්ටම 08

2.3 සංඛ්‍යා සටහන - පවුල්වල සාමාජිකයින්ගේ අධ්‍යාපන මට්ටම 08


තෙවන පරිච්ඡේදය


3.1 සංඛ්‍යා සටහන - ශ්‍රම බලකායේ ස්වභාය 11

3.2 සංඛ්‍යා සටහන - ගම්මානයේ ප්‍රධාන රැකියාවන්ලේ ස්වරූපය 11

3.3 සංඛ්‍යා සටහන - ගම්මානයේ ද්විතියික රැකියාවන්ගේ සවරූපය 12

3.4 සංඛ්‍යා සටහන - ගම්මානයේ රැකියා නියුතුවූවන්ගේ මාසික ආදායම 12

3.5 සංඛ්‍යා සටහන - රැකියා නියුක්තවූවන්ගේ සාමාන්‍ය මාසික ආදායම 13

3.6 සංඛ්‍යා සටහන - දළ වාර්ශික ආදායම 14

3.7 සංඛ්‍යා සටහන - දළ වාර්ෂික ආදායම් මට්ටම අනුව පවුල්වල ප්‍රමාණය ගම්මානයේ සීට්ටු දැමීම කරන පවුල් ගණන 15

3.8 සංඛ්‍යා සටහන - මූල්‍ය ආයතන සමඟ ඉතිරි කිරීම හා ගිනුම් ප්‍රමාණය සහ පවුල් ගණන 17

3.9 සංඛ්‍යා සටහන - ගම්මානයේ සීට්ටු දැමීම සිදුකළ වාර ගණන 18

3.10 සංඛ්‍යා සටහන - සීට්ටු දැමීම සිදුකළ වාර ගණන (2000 වසර සිට) 18

3.11 සංඛ්‍යා සටහන - ණය ලබාගැනීම්වල ස්වරූපය 19

3.12 සංඛ්‍යා සටහන - ගම්මානයේ ණය ලබා ගැනීම 19

3.13 සංඛ්‍යා සටහන - ණය ලබාගැනීමට හේතු 20


සිව්වන පරිච්ඡේදය


4.1 සංඛ්‍යා සටහන - ගම්මනයේ නිවාසවල විශාලත්වය 21

4.2 සංඛ්‍යා සටහන - නිවාසවල තත්ත්වය - වහලයේ ස්වභාවය 22

4.3 සංඛ්‍යා සටහන - නිවාසවල තත්ත්වය - බිත්තිවල ස්වභාවය 22

4.4 සංඛ්‍යා සටහන - නිවාසවල තත්ත්වය - බිම් ස්වභාවය 22

4.5 සංඛ්‍යා සටහන - නිවාසයන්හි කාමර ප්‍රමාණය අනුව නිවාස සංඛ්‍යාව 23

4.6. සංඛ්‍යා සටහන - නිවාසවල මුළුතැන්ගෙයි පිහිටීම 23

4.7 සංඛ්‍යා සටහන - මෝටර් රථයකින් යාහැකි පාරට ඇති ආසන්නම දුර 24

4.8 සංඛ්‍යා සටහන - විදුලිය ලබා ගැනී සඳහා ඇති ආසන්නම දුර 25

4.9 සංඛ්‍යා සටහන - පානීය ජලය සපයා ගන්නා ආකාරය 25

4.10 සංඛ්‍යා සටහන - පානීය ජලය ලබාගැනීම සඳහා වැසි කාලයේදී අසල්වැසි නිවසට යාම සඳහා ඇති දුර 26
4.11 සංඛ්‍යා සටහන - පායන කාලවලදී පානීය ජලය ලබාගැනීමට යායුතු දුර ප්‍රමාණය 26
4.12 සංඛ්‍යා සටහන - බීමට ලබාගන්නා ජලයේ තත්ත්වය 27
4.13 සංඛ්‍යා සටහන - බීමට සුදුසු ජලය ලබාගැනීම සඳහා කරන යෝජනා 27
4.14 සංඛ්‍යා සටහන - වැසිකිළි පහසුකම් හා ඒවායේ ස්වරූපය 28
4.15 සංඛ්‍යා සටහන - නිවෙස්වල ඇති ගෘහ විදුලි උපකරණ 28
4.16 සංඛ්‍යා සටහන - ගම්මානය තුළ දුම්බීම, බුලත් විට සහ මත්පැන් භාවිතය 29
4.17 සංඛ්‍යා සටහන - අවශ්‍ය වැදගත් සේවා සපයන ආයතනවලට ඇති දුර 30

පස්වන පරිච්ඡේදය

5.1 සංඛ්‍යා සටහන - ගොඩ ඉඩම්වල පවතින පසෙහි ස්වභාවය 32
5.2 සංඛ්‍යා සටහන - ගොඩ ඉඩම් පාංශු ඛාදනයට ලක්වී ඇති ආකාරය 33
5.3 සංඛ්‍යා සටහන - පාංශු ඛාදනය සිදුවීම 33
5.4 සංඛ්‍යා සටහන - ගොඩ ඉඩම් වගා නොකිරීමට හේතු 34

හත්වන පරිච්ඡේදය

7.1 සංඛ්‍යා සටහන - ප්‍රජා සංවිධානවල ප්‍රයෝජනවත්භාවය 36
7.2 සංඛ්‍යා සටහන - ප්‍රජා සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය 37
7.3 සංඛ්‍යා සටහන - ප්‍රජා සංවිධාන ක්‍රියාශීලීවීමට හේතු 37



පුස්තකාලය
LIBRARY
HARTI

# පළමුවැනි පරිච්ඡේදය
# හැඳින්වීම

## 1.1 ගම නැගුම වැඩසටහන

වර්තමාන රජය විසින් "මහින්ද චින්තන" ප්‍රතිපත්ති ප්‍රකාශය මත පදනම්ව ආරම්භ කර ඇති "ගම නැගුම වැඩසටහන" ග්‍රාමීය දුප්පත්කම නැති කිරීම සඳහා සහභාගීත්ව මෙන්ම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් හඳුන්වා දීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන ලද්දකි. ගම නැගුම සංකල්පයෙහි මූලික අදහස වන්නේ ගමෙහි සංවර්ධනය සඳහා සැලසුම් සැකසීම මෙන්ම ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ගමෙහි ජනතාව පාර්ශවකරුවන් බවට පත්කර ගැනීමය. මෙම වැඩසටහනෙහි "දැක්ම" වන්නේ ගම ජාතික සවංර්ධනයෙහි කේන්ද්‍රස්ථානය බවට පත් කිරීමය. "මෙහෙවර" වන්නේ ග්‍රාමීය ජනතාව තුළින් ගොඩ නැගෙන සහභාගීත්ව ප්‍රජා සංවර්ධන ජාලයක් ඔස්සේ ගම තුළ සංවර්ධනයක් රටෙහි ඇති කිරීමය.

ගම නැගුම වැඩසටහනෙහි අරමුණු පහත දැක්වේ.

1. ග්‍රාමීය ජනතාව සංවර්ධනයේ ඉලක්කයන් පමණක් නොව, සංවර්ධනයේ කොටස්කරුවන් බවට ද පත් කිරීම.
2. ග්‍රාමීය ජනතාවගේ සහභාගීත්වය තුළින් ගමේ ගැටලු සහ විභවතාවන් හඳුනා ගෙන, ගම කේන්ද්‍රකොට, ඔවුන් සංවර්ධනයේ පෙර ගමන්කරුවන් ලෙස සංවර්ධන ක්‍රියාවලිය දියත් කිරීම
3. ගම සංවර්ධනය කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර සම්පත් මනා ලෙස කළමනාකරණය කොට, ඵලදායී ලෙස යොදා ගැනීම සඳහා සැලසුම් සකස් කිරීම
4. දුප්පත්කම අවම කිරීම සඳහා අවශ්‍ය පිළියම් යොදමින් ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම

මුල් දෙවසර තුළ දී තෝරා ගත් ගම්වල නිවාස නොමැති පවුල්වලින් 50% කට නිවාස තනා දීම, එම ගම්වල විදුලිය නොමැති සියලුම පවුල්වලට විදුලි පහසුකම් සැපයීම, සියළුම ගම්වලට ආරක්ෂිත පානීය ජල පහසුකම් සැපයීම, සෑම ගමකටම වාහන ධාවනය කිරීමට යෝග්‍ය මාර්ගයක් සකස් කිරීම වැනි කෙටි කාලීන ඉලක්ක ද සෑම ගමකටම විදුලිය, පොදු සන්නිවේදන සේවා ලබාදීම හා අධ්‍යාපනය දියුණු කිරීම වැනි දිගු කාලීන ඉලක්ක සපුරා ගැනීමට ද මෙම වැඩසටහන මගින් අපේක්ෂා කෙරේ.

## 1.2 ගම නැගුම ආදර්ශ වැඩසටහන

ගම නැගුම වැඩසටහන යටතේ දියුණු කිරීම සඳහා ගම් තෝරා ගැනීම වට කිහිපයක් යටතේ සිදුවෙමින් පවතී. පළමු වටය සඳහා දිවයිනේ දිස්ත්‍රික්ක දහයක් නියෝජනය වන පරිදි ගම් දහයක් තෝරාගනු ලැබූ අතර එම ගම් ආදර්ශ ලෙස දියුණු කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. මේ අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කඩුවනත්ත හේන්යාය ගම්මානය ද ආදර්ශ ගම්මානයක් ලෙස දියුණු කිරීම සඳහා තෝරාගනු ලැබිය.

## 1.3 පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය

ගම නැගුම ආදර්ශ වැඩසටහන යටතේ අදාළ ව්‍යාපෘති ගම්වල සිදු කෙරෙන සංවර්ධන කටයුතුවල බලපෑම් හඳුනා ගනිමින් ව්‍යාපෘතිය ඇගයීමට ලක් කිරීමට හැකිවනු පිණිස එම ගම් පදනම් කරගෙන ඒවායෙහි පූර්ව- ව්‍යාපෘති සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ සමීක්ෂණයක් (පාදක සමීක්ෂණයක්) සිදු කරන ලෙස කෘෂිකර්ම සංවර්ධන අමාත්‍යාංශය විසින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයෙන් ඉල්ලා සිටිනු ලැබිණ. ඒ අනුව කඩුවනත්ත හේන්යාය ගම පදනම් කර ගනිමින් සිදුකළ අධ්‍යයනයෙහි සොයා ගැනීම් මෙම වාර්තාව මගින් එළි දැක්වේ. මෙම අධ්‍යයනයේදී ව්‍යාපෘතියෙහි දිගු කාලීන බලපෑම් හා අපේක්ෂිත ප්‍රතිඵල සපුරා ගැනීම් ගණනය කිරීමට හැකිවනු පිණිස ගම්වල ජනතාවගේ සාමාන්‍ය සමාජ ආර්ථික තත්ත්වය හා අදාළ තොරතුරු ලබා ගැනීමට අමතරව ව්‍යාපෘතියෙහි කෙටි කාලීන බලපෑම් ගණනය කිරීම සඳහා ගම්වල ඇති යටිතල පහසුකම් මෙන්ම අනෙකුත් සේවා පහසුකම්, කෘෂි තාක්ෂණ භාවිතයන් යනාදිය පිළිබඳව ද තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කෙරිණ.

## 1.4 අධ්‍යයනයෙහි අරමුණු

මෙම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ගම නැගුම වැඩසටහනෙහි ප්‍රථම අදියර යටතේ තෝරාගත් කඩුවනත්ත හේන්යාය ගමෙහි පවත්නා සමාජ ආර්ථික තත්ත්වය හා අදාළ තොරතුරු රැස් කිරීම හා වාර්තාගත කිරීමය.

එහි සුවිශේෂී අරමුණු වන්නේ,

i. අධ්‍යයනය සඳහා තෝරාගත් ගමෙහි ජනගහණ තොරතුරු එනම්, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම, අධ්‍යාපන හා සෞඛ්‍ය තත්ත්වය ආදිය මත පදනම්ව ජන සංඛ්‍යා සම්බන්ධ විස්තර ලබා ගැනීම

ii. අධ්‍යයන ගම්මානයේ ජීවන මාර්ග, රැකියාවන්හි ස්වභාවය, ආදායම් තත්ත්වය, ඉතිරි කිරීම හා ණයගැති භාවය පිළිබඳව අධ්‍යයනය කිරීම

iii. ගම්වාසීන්ට ඉඩම් භාවිතය සඳහා ඇති හැකියාව, ඉඩම් අයිතිය, බුක්තියෙහි ස්වභාවය හා ඉඩම් සම්බන්ධයෙන් ඇති ගැටලු විමසා බැලීම

iv. වැසියන්ගේ නිවාස අයිතිය, ඒවායෙහි ස්වභාවය හා ඒවා සඳහා ඇති පහසුකම් පිළිබඳව සොයා බැලීම

v. වැසියන්ගේ නිවාසවල ඇති බඩු බාහිරාදිය මෙන්ම කෘෂිකාර්මික උපකරණ පිළිබඳව විමසා බැලීම

vi. ගම්මානයේ ගමනාගමනය, විදුලි බලය, දුරකථන පහසුකම්, පානීය අවශ්‍යතා සඳහා මෙන්ම ස්නානය සඳහා ජල පහසුකම්, අධ්‍යාපනය, සෞඛ්‍ය, තාක්ෂණික දැනුම ලබාදීම හා අලෙවි පහසුකම් යනාදිය සම්බන්ධයෙන් ඇති යටිතල පහසුකම් පිළිබඳව අධ්‍යයනය

vii. ගම තුළ ක්‍රියාත්මක වන ප්‍රජා සංවිධාන හා ඒවා තුළ වැසියන් නියෝජනය මෙන්ම ගමෙහි සංවර්ධනය හා සම්බන්ධ තීරණ ගැනීම හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ සහභාගීත්වය පිළිබඳව විමර්ශනය කිරීම

viii. ජනතාව සතු ඉඩම් හා ජලය වැනි සම්පත් ඔවුන්ගේ නිෂ්පාදනය හා ආදායම් වර්ධනය සඳහා කෙතරම් දුරට කාර්යක්ෂම හා ඵලදායී ලෙස භාවිතයට ගන්නේ ද යන්න සොයා බැලීම

ix. වැසියන්ගේ ප්‍රධාන නිෂ්පාදන කටයුතු සඳහා තාක්ෂණික හා යෙදවුම් භාවිතයෙහි ස්වභාවය පිළිබඳව විමසීම

x. වැසියන්ගේ ප්‍රධාන නිෂ්පාදන කටයුතු සඳහා වන නිෂ්පාදන වියදම හා ලාභය ගණනය කිරීම

## 1.5 අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා ක්‍රම කිහිපයක් අනුගමනය කරනු ලැබිණ. මින් ප්‍රධාන ක්‍රමය වූයේ ගමෙහි පදිංචි පවුල් ආශ්‍රයෙන් සිදුකළ නියැදි සමීක්ෂණයයි. ගමෙහි පවුල්වලට අදාළ පෞද්ගලික තොරතුරු මෙන්ම එම ගමෙහි සංවර්ධනයට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා එමගින් උත්සාහ දැරිණි. ගමෙහි සංවර්ධනයට අදාළ පොදු තොරතුරු ලබා ගැනීම සඳහා ග්‍රාම නිලධාරීන්, කෘ.ප.නි.ස.වරුන් ප්‍රජා සංවිධාන නායකයින්, පාසල, පන්සල හා වෙනත් පොදු සේවා සපයන ආයතනවල ප්‍රධානීන් වැනි ප්‍රධාන තොරතුරු සපයන්නන් සමග සාකච්ඡා කරනු ලැබිණි. කෘෂිකර්මය, සත්ත්ව පාලනය, ස්වයං රැකියා, යනාදී විශේෂ ක්ෂේත්‍රයන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමේදී ඒ හා සම්බන්ධ කටයුතුවල නියුතු පුද්ගලයන් සමග කණ්ඩායම් සාකච්ඡා පවත්වනු ලැබිණ. මෙයට අමතරව ද්විතීයික දත්ත භාවිතා කිරීම ද සිදුකළ අතර විවිධ විෂයන්ට අදාළව ග්‍රාම නිලධාරී, කෘ.ප.නි.ස. වරුන්, පවුල් සෞඛ්‍ය සේවිකාවන් යන අයත් අදාල ගොවිජන සේවා මධ්‍යස්ථාන, පශු වෛද්‍ය කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ග්‍රාමීය බැංකු වැනි ආයතන මගින් දැනට රැස්කර ඇති තොරතුරු මේ යටතේ ලබා ගනු ලැබිණ. මෙසේ විවිධ මාර්ගයන්ගෙන් ලබාගත් තොරතුරු නියැදි සමීක්ෂණයෙන් ලබාගත් තොරතුරු සමග සම්බන්ධ කරනු ලැබිණ.

සමීක්ෂණය සඳහා ගමෙහි පදිංචි පවුල්වලින් අඩක් සසම්භාවී ක්‍රමයට (සසම්භාවී වගු භාවිතයෙන්) තෝරාගනු ලබන අතර පවුල් සංඛ්‍යාව 100ට අඩු ගම්වල මුළු පවුල් ප්‍රමාණයම සමීක්ෂණය සඳහා තෝරාගනු ලැබිණ. එම නිසා කුඩා ගම්මානයක් වන මෙම ගම්මානයේ සියලුම පවුල් සමීක්ෂණය සඳහා යොදා ගැණිනි. අදාළ පවුල්වලින් තොරතුරු ලබා ගැනීමේදී ප්‍රශ්නාවලියක් භාවිතා කරනු ලැබූ අතර එසේ තොරතුරු ලබා ගැනීමට ඒ ඒ ගම් ප්‍රදේශවලින් අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සමත් මෙන්ම උපාධිධාරී වැනි ඉහළ සුදුසුකම් ඇති තරුණ තරුණියන් සහභාගී කරගනු ලැබිය යුතු වුව මෙම ගමෙහි උපාධිධාරීන් නොමැති නිසා උසස් පෙළ විභාගයට පෙනී සිටි අය සහභාගී කර ගැණිනි. ග්‍රාම නිලධාරී, කෘ.ප.නි.ස., වැනි ප්‍රධාන තොරතුරු සපයන්නන් හා සාකච්ඡාකර ගමට අදාළ යටිතල පහසුකම්, සේවා ආයතන යනාදිය සම්බන්ධ තොරතුරු සපයා ගැනීම සඳහා ද පොදු ප්‍රශ්නාවලියක් භාවිත කරනු ලැබිණ.

## 1.6 අධ්‍යයන කාලය

මෙම අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගන්නා ලද්දේ 2006 ජූලි සහ අගෝස්තු අතර කාල සීමාව තුළදීය. ආදායම ගණනය කිරීමේදී 2005 අගෝස්තු සිට 2006 ජූලි දක්වා වූ වසරක කාල සීමාව පදනම් කරගනු

ලැබිණ. නිෂ්පාදනය හා සම්බන්ධ තොරතුරු ගැනීමේදී 2005 යල කන්නය හා 2005- 2006 මහ කන්නය පදනම් කරගනු ලැබිණ.

## 1.7 ගැටලු හා සීමා

කඩුවනත්ත හේන්යාය ගම්මානයේ ගම නැගුම පූර්ව ව්‍යාපෘති සමාජ ආර්ථික සමීක්ෂණය සිදුකිරීමේදී විවිධ ගැටලු සහ සීමාවන්ට මුහුණපාන්නට සිදුවිය. මෙහිදී මුහුණපෑමට සිදුවූ සීමාවන් ලෙස මූල්‍ය සීමාකම් දැක්විය හැකිය. කඩුවනත්ත හේන්යාය ගම්මානයේ තොරතුරු රැස් කිරීමට කොළඹ සිට රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ කඩුවනත්ත හේන්යාය ගම්මානය දක්වා දිගු දුරක් යා යුතුව තිබුණි. මූල්‍යමය තත්ත්වය ප්‍රමාණවත් නොමැතිකම නිසා ද අවස්ථා කිහිපයක් පමණක් ගම්මානය වෙත යාමට සිදුවිය. එහිදී මූලික සමාජ ආර්ථික සමීක්ෂණය සිදුකිරීමට අවශ්‍ය පවුල් තෝරා ගැනීම සඳහා අදාළ නිලධාරීන් හමුවීම මෙන්ම ගම්මානයේ පොදු තොරතුරු සාකච්ඡා කිරීම ආදී විශාල වැඩ කොටසක් නිමකළ යුතුව තිබුණි.

සමීක්ෂණය සඳහා තිබූ මූල්‍යමය සීමාකම් නිසා සමීක්ෂණය සිදු කිරීම සඳහා ආයතනයේ පර්යේෂණ නිලධාරීන් හට සමීක්ෂණයට අදාළ තොරතුරු රැස් කිරීමට සහභාගී වීමට නොහැකි විය. එම නිසා තොරතුරු රැස් කිරීමට ගම්මානයේ උපාධිධාරී හෝ අ.පො.ස. උ.පෙළ සමත් දෙදෙනෙකු සොයා ගැනීමද ඉතා දුෂ්කර විය. ගම්මානයේ කිසිදු උපාධිධාරියෙකු නොමැති වීමත් උසස් පෙළ සමත් වුවන් දෙතුන් දෙනෙකුට සීමා වීමත් මේ සඳහා හේතු විය. ගම්මානය සමාජ ආර්ථිකමය අතින් ඉතා පහළ තත්ත්වයක පැවතීම මේ සඳහා හේතු වී තිබේ. අනතුරුව උසස් පෙළ විභාගයට මුහුණ දුන් සිසුන් දෙදෙනෙකු සමීක්ෂණය සඳහා පර්යේෂණ සහකාරවරුන් වශයෙන් අනුයුක්ත කොට ගැණිනි.

මේ ආකාරයට සමීක්ෂණය මඟින්ම ගම්මානයේ තොරතුරු විචේකීව නිසි පරිදි රැස් කර ගැනීමට නොහැකි වීමද මෙම සමීක්ෂණයේදී අප මුහුණ දුන් බාධාවකි. ගම්මානයේ දී තොරතුරු රැස් කිරීමේදී ඒවා නිවැරදි ලෙස ලබා ගන්නා ආකාරය, ගොවි පවුල් සමග සාකච්ඡා කර එම තොරතුරු ලබා ගැනීමද සමීක්ෂකයන් නොවන වෙනත් අයට තරමක් අපහසු විය. එම නිසා මේ සඳහා යොදා ගනු ලැබූ පර්යේෂණ සහකාරවරුන් දෙදෙනා දින කිහිපයක් හොඳින් ඒ සඳහා පුහුණු කිරීමට සහ ඔවුන් විසින් නිම කරනු ලැබූ සියලු ප්‍රශ්නාවලියන් තුළ පැවති ගැටලු සාකච්ඡා කිරීම තුළින් ඒවා නිවැරදි කර ගැනීමටත් නිරන්තරයෙන් සිදු විය.

මෙයට අමතරව පර්යේෂණ කාල වකවානුවේ ප්‍රදේශයේ පැවති දැඩි වර්ෂා සහිත බවත් නිරන්තර ගංවතුර සහිත ප්‍රදේශයක් වීම මෙන්ම ප්‍රදේශයේ ඉතා දැඩි කඳු ශිකර සහිත ප්‍රදේශයක් වීම,ගම්මානයට වාහනයක් යාමට නොහැකිවීම මෙන්ම පා ගමනින් වුව යාමට නොහැකි ප්‍රදේශයක්වීම ද මුහුණ දුන් ප්‍රධාන ගැටලු වේ. එසේම ප්‍රදේශයේ කෘෂිකාර්මික මෙන්ම සත්ත්ව පාලන අංශය ද නොමැතිවීම නිසා ඒ සඳහා දත්ත හා තොරතුරු ලබා ගැනීමට නොහැකි විය. දෙතුන් දෙනෙකු ඒ සඳහා යම් තරමින් හෝ නියැලී සිටිය ද එය නියැදියක් තරම් හෝ යොදා ගැනීමට ප්‍රමාණවත් නොවීය. එම නිසා කෘෂි මෙන්ම සත්ත්ව පාලන අංශය ද අධ්‍යයනය කිරීමට මෙම දත්ත හා තොරතුරු ලබා ගැනීමට නොහැකි විය.

කෙසේ වුව මේ ආකාරයට ගම නැගුම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම ගම්මානයේ පැවති සමාජ ආර්ථික තත්ත්වය සොයා බැලීමට විවිධ ගැටලු මධ්‍යයේ වුව හැකිවිය. මෙම නව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් වසර කිහිපයකට පසු ඇති වන සමාජ ආර්ථිකමය තත්ත්වය මැන බැලීමට මෙය යොදා ගත හැකි වනු ඇත.

# දෙවන පරිච්ඡේදය

# අධ්‍යයනයේ ග්‍රාමීය සහ ජනගහන තොරතුරු

## 1. පිහිටීම

තෙත් කලාපයට අයත් ප්‍රධානතම සදාහරිත වනාන්තරය වන සිංහරාජ අඩවියට මායිම්ව සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කයේ වයඹ හා බටහිර දෙසට බරව පිහිටි ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය උතුරින් කුරුවිට හා කිරිඇල්ලත් නැගෙනහිරින් රත්නපුර හා පැල්මඩුල්ලත් බටහිරින් අයගමත් දකුණින් නිවිතිගලත් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට මායිම්ව පිහිටා ඇත.

රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17 අතුරින් විශාලත්වය මත 15 වන ස්ථානය ගන්නා ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශාලත්වය ව.කි.මී. 118.80 ක් වේ. මෙම කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 20 කින් සමන්විත වන අතර ගම්මාන 80 ක් එයට අයත් වේ. මෙම ප්‍රාදේශීය ලේකම් සහ ගොවිජන සේවා බලප්‍රදේශය තුළ පිහිටා ඇති පලාවෙල ග්‍රාමසේවා වසම තුළ අක්කර 13 1/2 ක කඳුශිකර සහ තද බෑවුම් සහිත මුළු භූමි ප්‍රදේශයන් තුළ කඩුවනත්ත ශේන්යාය ග්‍රාමය පිහිටා ඇත. ඇලපාත නගරයේ සිට කිලෝ මීටර් 4.5 ක් පමණ දුරින් මෙම ගම්මානය පිහිටා ඇත.

## 2. දේශගුණික තත්ත්වය

දේශගුණික තත්ත්වය අනුව පහත මැදරට තෙත් කලාපීය දේශගුණයක් පෙන්වන අතර අවුරුද්ද මුළුල්ලේම සම සීතෝෂ්ණ දේශගුණයක් පවතී[1]. නිරිතදිග මෝසමත් සමග අධික වර්ෂාපතනයක් ලැබෙන අතර ඒ නිසා ප්‍රදේශයේ පහත්බිම් ආශ්‍රිතව ගංවතුර තර්ජනය අධික ලෙස පවතී.

### 2.1 භූ විෂමතාවය සහ ජලවහනය

ගම්මානය මුහුදු මට්ටමේ සිට අඩි 200-500 අතර ප්‍රමාණයේ උසක් දක්වන අතර දිගාන, අළුත්පත්ගල, කුකුළුවා විහාරය, හබරගල හා පොත්ගුල් විහාරය කන්ද ආදී දර්ශනීය කඳු වළල්ලකින් ගම්මානය වටවී ඇත. සමස්ත භූමියම ගත්කළ තැනිතලා හා උස්බිම් සහිත රැළි ස්වභාවයක් ගනී. ප්‍රදේශය හරහා කිරිඇල්ල ගඟ හා හංගමු ගඟ ගලන අතර මේවා, මායිමක් වශයෙන් ඇති කළුගඟට සම්බන්ධ වන ප්‍රධාන ශාඛා ගංගා 02 ක් ලෙස දැක්විය හැකිය. ප්‍රදේශයේ පෝෂක ප්‍රදේශ තැනීමට මෙන්ම ගංවතුර තර්ජනයට මෙම ගංගා ඉවහල්වන අතර ප්‍රදේශය තුළ මෙම ගංගා සම්බන්ධ වන තවත් ජලවහන රාශියක් දක්නට ලැබේ.

[1] "සම්පත් පැතිකඩ" 2003 - ඇලපාත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය

## 3. ඓතිහාසික තත්ත්වය හා ජනාවාසවීම

ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීමේදී මෙම ගම්මානය වලගම්බා රජ සමය තෙක් ඈතට දිවෙන අතර එදා සිට මේ දක්වා ජනගහනයෙන් වැඩි පිරිසක් ගොඩ මඩ යැපීම් ගොවිතැනින් ජීවනෝපාය කරගෙන යමින් පවතී. පුරාවෘත්තවලට අනුව වලගම්බා රජතුමා ස්නානය කොට ඒ අසළ ගල් තලාවක් උඩ කඩුව තැබීමෙන් පසුව රජුට අමතක වීමෙන් මෙම කඩුව නැතිවූ නිසා 'කඩුව නැතිවුන හේන්යාය' කඩුවනැත්තෙ හේන්යාය ලෙස නම පටබැඳී ඇත. එදා ගම්මානයේ පවුල් 03 ක් පමණ ජීවත්ව සිටි බවත් ක්‍රමික විකාශනය තුළ මේ වනවිට පවුල් 49 දක්වා ඉහළගොස් ඇති බවත් පැවසේ. කෙසේ වුව මෙම ගම්මානය අවට ප්‍රදේශයේ පැවති රදල ප්‍රභූ පවුල්වලට සේවය කරන ලද ගමක් ලෙස මෙම ගම්මානය හඳුනාගත හැකිය. එමනිසා ජනාවාස වීම ඉතා මන්දගාමීව සිදුවූ. රදල වලව් පැලැන්තිවලට සේවය කළ ඉඩම් භුක්තියට හිමිකම් නොකියන ලද ගම්මානයක් ලෙස පැවත තිබේ. ප්‍රදේශයේ ඇති ඇලපාත වලව්වට ගම්මුන් තුළ අදත් ගැමිකම තුළ ඇති පක්ෂපාතීත්වයට නැඹුරු වූ ගෞරවයක් පවතී. වර්තමානය වන විට ගොඩ ඉඩම් අක්කර 12 1/2 ක් සහ මඩ ඉඩම් අක්කර 01 ක් ලෙස රජයෙන් බෙදා දී තිබේ. මේවා බොහොමයක් සඳහා ජයභූමි ඔප්පු ලබාදී ඇත.

## 4. ජනගහනය

මෙම ගම්මානයේ සිටින මුළු පවුල් සංඛ්‍යාව 49 තුළ ස්ත්‍රී සහ පුරුෂ පිළිවෙලින් 102 ක් හා 101 ක් ලෙස මුළු ජනගහනය 203 ක් ජීවත් වේ. ගම්මානයේ සියලුම දෙනා සිංහල බෞද්ධයින් වන අතර ප්‍රදේශ තුළ විශේෂිත කුල කණ්ඩායම් ජීවත් නොවේ. විශේෂයෙන්ම වයස් ව්‍යුහය අනුව ජනගහනය 2.1 සංඛ්‍යා සටහනින් පෙන්නුම් කරන අතර යැපුම් මට්ටමේ ජනගහනය ලෙස 132 පමණ හඳුනාගත හැකිවිය. එනම් යැපෙන්නන්ගේ අනුපාතය 64% ක් වේ.

2.1 සංඛ්‍යා සටහන : වයස් කාණ්ඩ අනුව ජනගහනය

| වයස් කාණ්ඩය | ජනගහනය | | | | සංඛ්‍යාව | % |
|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | % | පුරුෂ | % | | |
| අවුරුදු 04 ට අඩු | 12 | 5.9 | 10 | 4.9 | 22 | 10.8 |
| 05 - 09 අතර | 10 | 4.9 | 07 | 3.4 | 17 | 8.4 |
| 10 - 14 අතර | 18 | 8.9 | 18 | 8.9 | 36 | 17.7 |
| 15 - 24 අතර | 09 | 4.4 | 18 | 8.9 | 27 | 13.3 |
| 25 - 34 අතර | 16 | 7.9 | 14 | 6.9 | 30 | 14.8 |
| 35 - 44 අතර | 18 | 8.9 | 17 | 8.4 | 35 | 17.2 |
| 45 - 54 අතර | 08 | 3.9 | 12 | 5.9 | 20 | 9.9 |
| 55 - 64 අතර | 03 | 1.5 | 04 | 2.0 | 07 | 3.4 |
| 65 - 74 අතර | 04 | 2.0 | 0 | 0 | 04 | 2.0 |
| 75 ට වැඩි | 03 | 1.5 | 02 | 1.0 | 05 | 2.5 |
| එකතුව | 101 | 49.8 | 102 | 50.2 | 203 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

## 5. අධ්‍යාපන තත්ත්වය

ගම්මානයේ සමාජීය ආර්ථික තත්ත්වය මැන බලන ප්‍රධාන දර්ශකයක් ලෙස අධ්‍යාපනික තත්ත්වය සළකා බැලීමේදී එය එතරම් සතුටුදායක තත්ත්වයක නොපවතින බව පෙනීයන කරුණක් විය. ගම්මානයේ 48% ක්ම ද්විතීයික මට්ටමේ එනම් 6 වසරත් 10 වසරත් අතර අධ්‍යාපනය ලැබූ අය වේ. උ.පෙළ සමත් තිදෙනෙකු සහ සා.පෙළ සමත් 10 දෙනෙකු ද ගම්වාසීන් අතර වේ. පාසල් නොයන මට්ටමේ ළමුන් 05 පමණ ගම්මානය තුළ සිටී. මේ සඳහා ගම්මානයේ සමාජ ආර්ථික රටාව හේතුවී ඇති බව පෙනී ගිය අතර වැඩිහිටි අයගේ සාක්ෂරතාවද ඉතා පහළ මට්ටමක පැවතීම ගම්මානය තුළ මෙවන් අධ්‍යාපන මට්ටමක් පැවතීමට හේතු වී තිබේ. එසේම ඔවුන්ගේ ජීවන රටාව හැඩගැසී ඇති ආකාරය අනුව ළමුන්ගේ ද පාසල් ගමන තීරණය වී තිබේ. ඔවුන් දෛනික වැටුපට අවට ගම්මානවල කුළිවැඩ කිරීමට පෙළඹී තිබේ. කාන්තාවන් තේ දළු නෙලීමටත් පිරිමින් පතල් වැඩ සඳහාත් යොමුවීම නිසා ළමුන් ද එවන් කටයුතු සඳහා යොදාගැනීම සිදුවේ.

2.2 සංඛ්‍යා සටහන : ගෘහ මූලිකයින්ගේ අධ්‍යාපන මට්ටම

| කාණ්ඩය | පුරුෂ | | ස්ත්‍රී | | මුළු ගණන | % |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | |
| ප්‍රාථමික (1-5 පන්තිය) | 18 | 36.7 | 0 | 0 | 18 | 36.7 |
| ද්විතීයික (6-සා.පෙළ දක්වා) | 15 | 30.6 | 01 | 2.0 | 16 | 32.7 |
| අ.පො.ස. සා.පෙළ සමත් | 2 | 4.1 | 0 | 0 | 02 | 4.1 |
| අ.පො.ස. උ.පෙළ සමත් | 1 | 2.0 | 0 | 0 | 01 | 2.0 |
| පාසල් නොගිය ලිවීමට කියවීමට හැකි | 1 | 2.0 | 0 | 0 | 01 | 2.0 |
| පාසල් නොගිය ලිවීමට කියවීමට නොහැකි | 8 | 16.3 | 03 | 6.1 | 10 | 22.4 |
| එකතුව | 45 | 91.9 | 4 | 8.1 | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

2.3 සංඛ්‍යා සටහන : පවුල්වල සාමාජිකයින්ගේ අධ්‍යාපන මට්ටම

| කාණ්ඩය | පුරුෂ | | ස්ත්‍රී | | මුළු ගණන | % |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | |
| ප්‍රාථමික (1-5 පන්තිය) | 11 | 5.4 | 13 | 6.4 | 24 | 11.8 |
| ද්විතීයික (6-සා.පෙළ දක්වා) | 28 | 13.8 | 17 | 8.4 | 45 | 22.2 |
| අ.පො.ස. සා.පෙළ සමත් | 47 | 23.2 | 50 | 24.6 | 98 | 47.8 |
| අ.පො.ස. උ.පෙළ සමත් | 05 | 2.5 | 03 | 1.5 | 10 | 3.9 |
| පාසල් නොගිය ලිවීමට කියවීමට හැකි | 1 | 0.5 | 01 | 0.5 | 02 | 1.0 |
| පාසල් නොගිය ලිවීමට කියවීමට නොහැකි | 0 | 0 | 01 | 0.5 | 01 | 0.5 |
| | 1 | 0.5 | 0 | 0 | 01 | 0.5 |
| | 9 | 44 | 16 | 7.9 | 25 | 12.3 |
| එකතුව | 102 | 50.2 | 101 | 49.8 | 203 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ඉහත සටහන අනුව පෙනී යන්නේ ගම්මානයෙන් සැළකිය යුතු පිරිසක් ද්විතීයික අධ්‍යාපනය මට්ටමට (6-10) වඩා පහළ තත්ත්වයක පසුවන බවයි. මේ අකාරයට අධ්‍යාපන මට්ටම ඉතා පහළ මට්ටමක පැවතීමට ගම්මානයේ ජීවන තත්ත්වය හේතුවී තිබේ. එනම් මෙම ගම්මානය රත්නපුර දිස්ත්‍රික්කයේ දුප්පත්ම ග්‍රාම සේවා වසම වන අතරම ලංකාවෙන්ම 09 වන ස්ථානය ගනී. ඒ අනුව අධ්‍යාපන තත්ත්වය මෙවන් මට්ටමක පැවතීමට හේතු ඒ තුළ හඳුනාගත හැකිය. වයස අවු. 5-14 අතර පාසල් නොයන අය සිටින පවුලේ සාමාජිකයන්ගේ පාසල් නොයාමට හෝ අධ්‍යාපනය නතරවීමට හේතු ලෙස ආර්ථික අපහසුතාවන් හා පහත් ජීවන තත්ත්වය ප්‍රධාන වශයෙන් හඳුනා ගත හැකිවිය.

# තුන්වන පරිච්ඡේදය

# ආර්ථික කටයුතු, රැකියාවන්හි ස්වභාවය හා ආදායම

## 3.1 සේවා නියුක්තිය

ගම්මානයේ ආර්ථික කටයුතු පිළිබඳව සළකා බැලීමේ ප්‍රධාන නිර්නායකයන් ලෙස සේවා නියුක්තිය අධ්‍යයනයේදී යොදා ගැනිණි. මෙහි ශ්‍රම බලකායේ සේවා නියුක්තිකයන්ගේ ප්‍රතිශතය 95% පමණ වේ. මේ තුළ රජයේ සේවකයින් 03 පමණ සිටින අතර ඉතා පැරණීම රජයේ සේවකයා කොන්ත්‍රාත් පදනම මත වසර 15 ක පමණ සිට මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරන්නෙකි. අනෙක් දෙදෙනා ඉතා මෑතකදී රජයේ සේවය සම්බන්ධ වූවෝ වෙති.

ගම්මානයේ සේවා වියුක්ත ප්‍රතිශතය 5% පමණ වන අතර මෙයින් බොහොමයක් දෙනා කුළී වැඩ හෝ අපේක්ෂාවෙන් සිටී.

## 3.2 ආර්ථික කටයුතු සහ ආදායම් මාර්ග

ගම්මානයේ පවුල් 49 න් පවුල් 46 ක්ම (94%) සමෘද්ධිලාභීන් වන අතර අති බහුතරයකට ස්ථිර රැකියා නොමැත. ගමෙහි පුරුෂ පාර්ශවය අවට ගම්මානවල මැණික් කර්මාන්තය ආශ්‍රිත කුළී කම්කරුවන් ලෙසත් කාන්තාවන් බොහොමයක් අසළ ගම්වල තේ දළු නෙළීම හා සම්බන්ධව දෛනික වැටුප් ලබන්නන් ලෙසත් කටයුතු කරති. එසේම මෙම ගම්මානය තුළ අනෙකුත් ආදායම් මාර්ග ලෙස කෘෂි උපකරණ කුළියට දීම වැනි අංශයන් දක්නට නොමැත.

## 3.3 ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වභාවය

වර්තමානයේ අර්ථ දැක්වීම අනුව ශ්‍රම බලකාය යනු වයස අවු. 10 හෝ ඊට වැඩි රැකියා කරන හෝ රැකියා අපේක්ෂාවෙන් සිටින ජනගහනය වේ. ශ්‍රම බලකායේ ස්වරූපය වගු අංක 3.1 තුළින් දැක්වේ. ගම්මානයේ ශ්‍රම බලකායෙහි රැකියාවන්හි ස්වභාවය හඳුනා ගැනීමේදී ප්‍රධාන රැකියාවන් ලෙස රජයේ රැකියා කරන 03 දෙනෙකු සිටින අතර අනෙක් රැකියා කරන්නන්ගේ ස්වරූපය පහත වගු අංක 3.2 තුළින් පෙන්නුම් කෙරේ.

ගම්මානයේ ආරක්ෂක හමුදාවන්හි කිසිවෙකු නොමැති අතර විදේශීය රැකියාවක නියැලෙන එක් කාන්තාවක් සිටී.

3.1 සංඛ්‍යා සටහන : ශ්‍රම බලකායේ ස්වභාවය

| ශ්‍රම බලකායේ ස්වභාවය | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| රැකියා නියුක්ත | 49 | 64.5 | 23 | 30.3 | 72 | 94.7 |
| රැකියා වියුක්ත | 2 | 2.6 | 2 | 2.6 | 4 | 5.3 |
| එකතුව | 51 | 61.7 | 25 | 32.9 | 76 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

වැටුප් ලබන රැකියාවල තත්ත්වය 3.2 සංඛ්‍යා සටහන තුළින් ඉදිරිපත් කෙරේ. ස්ථිර රැකියාවන්හි ඉතා සුළු වශයෙන් මෙන්ම තාවකාලික රැකියා ගම්මානයේ වැඩි පිරිසක් නියැලෙස බව ඒ තුළ දැකගත හැකිය.

සේවා නියුක්තිකයින්ගෙන් 85% ක් පමණ, තාවකාලික සහ අනියම් තත්ත්වයේ රැකියාවල නියුතු පිරිස් ලෙස හඳුනාගත හැක. මෙයින් සැළකිය යුතු පිරිසක් කෘෂි කම්කරුවන් වේ. මෙම ගම්මානයේ මුළු ජනගහනයෙන්, එනම් 203 දෙදෙනෙකුගෙන් 72 දෙනෙකු රැකියාවන්හි නියුතු අතර ඔවුන්ගෙන් 49 පුරුෂයින් වන අතර 23 දෙනෙකු ස්ත්‍රීන් වේ.

3.2 සංඛ්‍යා සටහන : ගම්මානයේ ප්‍රධාන රැකියාවන්හි ස්වරූපය

| රැකියාවෙහි ස්වරූපය | ස්ත්‍රී | | පුරුෂ | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| ගොවි කාරක | 01 | 1.4 | 5 | 6.9 | 06 | 8.3 |
| ගොවිපළ සහායක | 01 | 1.4 | 0 | 0 | 01 | 1.4 |
| කෘෂි කම්කරු | 17 | 23.6 | 17 | 23.6 | 34 | 47.2 |
| කෘෂි නොවන කම්කරු | 0 | 0 | 19 | 26.4 | 19 | 26.4 |
| රාජ්‍ය අංශවල රැකියා | 2 | 2.8 | 1 | 2.8 | 04 | 5.6 |
| පෞද්ගලික අංශයේ | 0 | 0 | 3 | 4.2 | 03 | 4.2 |
| රැකියා | 01 | 1.4 | 2 | 2.8 | 03 | 4.2 |
| ස්වයං රැකියා | 0 | 0 | 1 | 1.4 | 01 | 1.40 |
| ශිල්පීය රැකියා | - | 1.4 | - | - | 01 | 1.4 |
| ව්‍යාපාරික | 01 | - | 0 | - | - | - |
| විදේශ රැකියා | | | | | | |
| එකතුව | 23 | 31.9 | 49 | 68.1 | 72 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානයේ රැකියා කරන්නන්ගෙන් 73% ක් පමණ කෘෂි හා කෘෂි නොවන කම්කරුවන් වශයෙන් හඳුනාගත හැකි අතර කෘෂි කම්කරු ලෙස තේ දළු නෙලීම සහ වතුවැඩ මෙන්ම කෘෂි නොවන කම්කරු ලෙස පතල් ආශ්‍රිත රැකියාවන්හි නියැලීමත් සිදුවේ.

3.3 සංඛ්‍යා සටහන : ගම්මානයේ ද්විතීයික රැකියාවන්හි ස්වරූපය

| රැකියාවන්හි ස්වරූපය | ස්ත්‍රී | | පුරුෂ | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | %. |
| වාර්තා වී නොමැත | 15 | 20.5 | 26 | 35.6 | 41 | 56.2 |
| ගොවි කාරක | 01 | 1.4 | 21 | 28.8 | 22 | 30.1 |
| ගොවිපළ සහායක | 08 | 11.0 | 02 | 2.7 | 10 | 13.7 |
| එකතුව | 24 | 32.9 | 49 | 67.1 | 73 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

3.4 ආදායම

සාමාජීය ආර්ථික තත්ත්වය පිළිබඳව මැන බලන ප්‍රධානතම මිනුම් ඒකක අතර ඒ ඒ පවුල් විසින් උපයන ආදායම් මට්ටම් සළකනු ලැබේ. මෙයට පෙර වැඩි පිරිසකගේ ප්‍රධාන ආර්ථික කටයුතු මෙන්ම අනෙකුත් ආදායම් මාර්ග පිළිබඳ සඳහන් කළ අතර මෙහිදී දළ වාර්ෂික ආදායම් මට්ටම් අනුව පවුල් ප්‍රතිශතය සහ ආදායමේ සංයුතිය සළකා බැලේ. එනම් වාර්ෂික ආදායමට විවිධ මාර්ගවලින් ලැබෙන ආදායම් මගින් කරන දායකත්වය පිළිබඳව අධ්‍යයනය කරනු ලැබේ.

ගම්මානයේ රැකියා කරන්නන්ගේ සාමාන්‍ය මාසික ආදායම පහත දැක්වෙන සටහන තුළින් දැකගත හැක.

3.4 සංඛ්‍යා සටහන : ගම්මානයේ රැකියා නියුතුවූවන්ගේ සාමාන්‍ය මාසික ආදායම

| ආදායම් කාණ්ඩය (රුපියල්) | පවුල් සංඛ්‍යාව | |
|---|---|---|
| | සංඛ්‍යාව | % |
| 1000 ට අඩු | 17 | 27 |
| 1000-2500 | 17 | 27 |
| 2500-5000 | 17 | 27 |
| 5000-7500 | 6 | 9.5 |
| 7500-10000 | 3 | 4.8 |
| 10000-15000 | 3 | 4.8 |
| එකතුව | 63 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

රු.50.00 ට වඩා අඩු මාසික ආදායමක් ලබන 81% ක් ගම්මානයේ ජීවත්වන බව ඉහත සටහන අනුව පැහැදිලි වේ.

3.5 සංඛ්‍යා සටහන : රැකියා නියුක්තිකයන්ගේ සාමාන්‍ය මාසික ආදායම් මාර්ග

| ආදායම් කාණ්ඩය (රු.) | කෘෂි කම්කරු | කෘෂි නොවන කම්කරු | රාජ්‍ය අංශයේ රැකියා | පෞද්ගලික අංශයේ රැකියා | ශිල්පීය රැකියා (වඩු කාර්මික) | විදේශීය රැකියා | ස්වයං රැකියා | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1000 ට අඩු | 1 | 17 | - | - | - | - | - | 18 |
| 1000-2500 | 16 | 1 | - | - | - | - | - | 17 |
| 2500-5000 | 14 | 1 | - | - | - | - | - | 15 |
| 5000-7500 | 1 | 2 | 1 | 1 | 0 | 1 | 1 | 7 |
| 7500-10000 | 0 | 1 | 1 | 0 | 1 | 0 | 0 | 3 |
| 10000-15000 | 0 | 0 | 1 | 2 | 0 | 0 | 0 | 3 |
| එකතුව | 32 | 22 | 3 | 3 | 1 | 1 | 1 | 63 |
| % | 50.8 | 33.3 | 6.3 | 4.8 | 1.6 | 1.6 | 1.6 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානයේ රැකියා කරන 63 දෙනා අතුරින් 50.8% ක්ම කෘෂිකාර්මික ක්ෂේත්‍රය ආශ්‍රිතව කම්කරු වෘත්තියේ යෙදෙන අතර 33.3% ක් ම යෙදී ඇත්තේ කෘෂිකාර්මික නොවන කම්කරු වෘත්තීන්හිය. අනෙකුත් සියළු දෙනා එනම් 15% ක් පමණ පිරිස වෘත්තීන් කිහිපයක් තුළ නියැලී සිටී. එම පිරිසට රජයේ රැකියා කරන කිහිපදෙනෙකු පෞද්ගලික අංශය නියෝජනය කරන කිහිපදෙනෙකු, එක් වඩු කාර්මිකයෙකු සහ ස්වයං රැකියාවක නියුක්තිකයෙකු ඇතුළත් වේ.

## 3.5 ආදායමේ සංයුතිය

ගමෙහි පවතින ආර්ථික කටයුතු පිළිබඳව විමසීමේදී එක් පවුලකට ආදායම් මාර්ග කිහිපයක් පැවතිය හැකි අතර තවත් පවුලකට එක් ආදායම් මාර්ගයක් පමණක් පැවතිය හැකිය. එසේම ගම්මානය තුළ බහුල ආදායම් මාර්ග මෙන්ම සුළු වශයෙන් පවතින ආදායම් මාර්ග මොනවාද යන්නත් මෙම සංයුතිය පිළිබඳ විමසීමේදී හඳුනාගත හැකිය.

මෙම ආදායම් සංයුතිය දෙස බැලීමේදී පෙනී යනුයේ රජයේ සහනාධාර ඉදිරියෙනුත් සහ කෘෂි කම්කරු සහ කෘෂි නොවන කම්කරුවන්ගේ දායකත්වය ප්‍රමුඛත්වයක් ගෙන ඇති බවයි. මෙම ආදායම් සංයුතිය තුළ පැහැදිලිවන තවත් කරුණක් වනුයේ වාර්ෂික ආදායම රු. 10,000 ට වඩා අඩුවෙන් ඇති පවුල් ප්‍රතිශතය 50% කට ආසන්න තත්ත්වයක පැවතීමයි. ඉහළ ආදායම් කාණ්ඩ යටතේ එනම් රු. 100,000 ක වාර්ෂික ආදායමක් උපයන පිරිස 5% ක් පමණ වේ. රාජ්‍ය සේවයේ සිටින තිදෙනෙකු සහ විදේශ රැකියාවන්හි නියුතු අයෙකු ඇතුළු 5 දෙනෙකු පමණ මේ තුළ නියෝජනය වේ.



21450

පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

3.6 සංඛ්‍යා සටහන : දළ වාර්ෂික ආදායම

| ආදායම් මාර්ග | ආදායම් මාර්ගයේ නියුක්ත වුවන් | | උපයන මුදල (රු.) | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | මුළු සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස | මුදල | % |
| වී ගොවිතැන | 02 | 1.5 | 42610 | 1.1 |
| වැවිලි බෝග වගාව | 20 | 19.7 | 596161 | 16.0 |
| වෙනත් සියලු බෝග | 1 | 0.7 | 34560 | 0.9 |
| සත්ත්ව පාලනය | 1 | 0.7 | 2560 | 0.1 |
| රජයේ රැකියා | 3 | 2.2 | 294482 | 7.9 |
| පෞද්ගලික අංශයේ රැකියා | 1 | 0.7 | 24000 | 6.4 |
| කෘෂිකාර්මික කම්කරු | 27 | 19.7 | 769685 | 20.6 |
| කෘෂිකාර්මික නොවන කම්කරු | 21 | 15.3 | 644990 | 17.3 |
| පුහුණු ශ්‍රමික (වඩු කාර්මික) | 1 | 0.7 | 57600 | 1.5 |
| ස්වයං රැකියා | 4 | 2.9 | 144000 | 3.9 |
| මැද පෙරදිග | 2 | 1.5 | 189000 | 5.1 |
| විශ්‍රාම වැටුප් කුලී හා බදු | 1 | 0.7 | 10,000 | 0.3 |
| රජයේ සහනාධාර | 46 | 27 | 205080 | 5.5 |
| මැණික් ගැරීම | 8 | 5.8 | 505800 | 13.5 |
| **එකතුව** | 137 | 100 | 37,36528 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

මෙම දළ වාර්ෂික ආදායම් සංයුතිය තුළද පෙනී යනුයේ රජයේ සහනාධාර සහ කෘෂිකාර්මික අංශයේ සහ කෘෂි අංශයේ නොවන කම්කරු රැකියාවලින් ලබන ආදායම් ප්‍රමුඛස්ථානයක් ගෙන තිබීමයි. කෙසේ වුව ද කෘෂිකාර්මික අංශයේ රැකියා යනු තම ප්‍රදේශයේ හෝ ප්‍රදේශයෙන් පිටත ගොස් රැකියාවල නියැලීම වේ.

3.5.1 දුප්පත්කම

දුප්පත්කම හෙවත් දරිද්‍රතාව යනු ජන කොට්ඨාසයක් සමාජ ආර්ථිකමය තත්ත්වය අතින් ඉතාම පහළ තත්ත්වයක පැවතීමයි. ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවෙන් වැඩිම කොට්ඨාසය ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන අතර එයට ලංකාවේ දුප්පත්කම වැඩිම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතුරින් 09 වන ස්ථානය ද හිමිවේ. එහි ජීවත්වන මුළු පවුල් සංඛ්‍යාවෙන් 40.1% ක් දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින අතර එම ජනගහනය 14369 කි.

ලංකාවේ දරිද්‍රතාවයෙන් ඉදිරියෙන්ම සිටින ගම්මානයක් ලෙස එම ගම්මාන සඳහා අවශ්‍ය පහසුකම් ලබාදෙමින් ගම් දියුණු කිරීමේ ගම නැගුම කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ටාසයෙහි

දුප්පත්කම අතින් ඉහළින්ම සිටින වඩාත් අඩු හා අඩු ජීවන මට්ටමකින් යුතු ජනගහනක් සිටින කඩුවනත්ත ශේන්යාය ගම්මානය තෝරාගෙන ඇත.

ලංකාවේ අඩු ආදායම්ලාභී ජන කොට්ඨාස තෝරාගෙන ඔවුන්ට රජයෙන් ලබාදෙන සමෘද්ධි සහනාධාරය දුප්පත්කම පිළිබඳ අදහසක් ලබාදෙන ප්‍රධාන නිර්ණායකයක් වී ඇත. මෙම ගම්මානයේ සිටින පවුල් 49 න් 46 ක්ම සමෘද්ධි ප්‍රතිලාභීන් වේ. මෙය ගම්මානයේ පවතින පහළ මට්ටම පෙන්නුම් කරන හොඳම සාධකයකි. එනම් ගමෙන් 94% ක්ම සමෘද්ධිලාභීන් වේ. ගම්මානයේ සිටින අනෙක් පවුල් තුනේ එක් අයෙකු බැගින් රජයේ සේවයේ රැකියාවක් කිරීම ඔවුන් නුසුදුසු වීමට හේතු වී තිබේ. නමුත් ඔවුන් ද පහළ ජීවන මට්ටමේ පවතින පවුල් බව නිරීක්ෂණයේදී පැහැදිලි විය.

3.7 සංඛ්‍යා සටහන : දළ වාර්ෂික ආදායම් මට්ටම අනුව පවුල් සංඛ්‍යාව

| ආදායම් කාණ්ඩය (රුපියල්) | පවුල් සංඛ්‍යාව | ආදයම | මුළු ආදායම |
|---|---|---|---|
| 1000-5000 | 2 | 4800 | 9600 |
| 5000-10,000 | 4 | 7,626 | 305,04 |
| 10,000-15,000 | 1 | 12,220 | 122,20 |
| 15,000- 25,000 | 2 | 19,080 | 381,60 |
| 25,000- 50,000 | 17 | 37,946 | 645,098 |
| 50,000 - 75,000 | 7 | 58,702 | 410,916 |
| 75,000 – 100,000 | 4 | 87,747 | 350,990 |
| 100,000 ට වැඩි | 12 | 17,2233 | 223,9040 |
| **එකතුව** | **49** | 74730 | 373,6528 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ඉහත සටහන තුළින් ගම්මානයේ දළ වාර්ෂික ආදායම් මට්ටම් අනුව පවුල්වල සංඛ්‍යාව මෙන්ම ඒ ඒ පවුල්වල ආදායම්හි එකතුවත් මුළු පවුල්වල ආදායම්හි එකතුවත් දැක්වේ. පවුල් 49 න් 17 ක් පමණ වාර්ෂික ආදායම රු. 37,946 ක සාමාන්‍ය මට්ටමක පවතින බව ද ඒ තුළ දැකගත හැකිය.

### 3.5.2 දුප්පත්කමේ ස්වභාවය සහ එයට බලපා ඇති හේතු

වැඩවසම් ක්‍රමය සමග බැඳුණු හේතු සාධක මෙම ගමෙහි දුප්පත්කම සඳහා බලපා ඇත. එනම් ඉතා කුඩා බිම් ප්‍රදේශයක් තුළ අක්කර 13 ක වපසරියක පිහිටා ඇති ගම්මානය තුළ ජීවත්වන්නන්ට තමන්ගේම කෘෂිකාර්මික ජීවන රටාවකට හිමිකම් කියාපෑමට හැකියාවක් නොමැත. එනම් ඒ සඳහා ප්‍රමාණවත් භූමි ප්‍රමාණයක් නොමැත. ගෙවතු වගා ක්‍රම හැරෙන්නට වෙනත් බෝග වගා කිරීමට ඉඩම් නොමැත. එමෙන්ම පාරම්පරිකවම මෙම ගම්මානය රදළ පැලැන්තියට එනම් ඇලපාත වලව්වට සේවය කරන ලද ගම්මානයක්ව පැවත තිබේ. ඒ අනුව ගැමියන්ට ස්වකීය අභිමතය පරිදි ගම්මානයේ වගා කටයුතු හෝ වෙනත් කටයුත්තක් කිරීමට නොහැකිව තිබේ. තම ඉඩමේ ඇති කොස් ගසක් නිවසේ අවශ්‍යතාවයට පාවිච්චියට ගැනීමට නම් එම ගස කපා ඇලපාත වලව්වට ගොස් ඉරා

තම ප්‍රමාණය පමණක් රැගෙන යා යුතුය. එසේ නොමැතිව තමන්ට රිසි පරිදි එම ගස් වුව පාවිච්චි කිරීමට නොහැක. මේ ආකාරයට එක් අයෙකු ගසක් කැපූ විට එය පවුල් ගණනාවකට පාවිච්චි කළ යුතු විය. වර්තමානය වන විට ගම්මානයේ කොස් ගස් 318 ක් පමණ තිබේ. මේ ආකාරයට වලව් පැලැන්තියට සේවය කිරීමට මෙම ගම්මානයේ ජීවත් වුවන් යොදා ගැනීම නිසා ඔවුන්ට තම ආර්ථික ජීවන රටාව, අධ්‍යාපනය, සමාජ තත්ත්වය නොලැබී ඇත. මෙම පසුබිම් තත්ත්වයන් වර්තමානයේ පවතින දුප්පත්කම ඇතිවීමට හේතු වී තිබේ

## 3.6 ඉතිරි කිරීම්

සමාජ ආර්ථිකමය තත්ත්වය තුළ තම වර්තමාන ඉපයීම් තුළින් අනාගතයේ යම් දෙයකට අවශ්‍ය වෙතැයි අපේක්ෂාවෙන් කිසියම් මුදලක් ආරක්ෂා කර තබා ගැනීම ඉතුරුම් ලෙස දැක්විය හැකි අතර මේවා විධිමත් ක්‍රම මෙන්ම අවිධිමත් ක්‍රම ඔස්සේ ගැමි ජීවිතය තුළ දැකිය හැකිය. විධිමත් ක්‍රම ලෙස බැංකු වැනි ඉතුරුම් ආයතනයන් ද අවිධිමත් ක්‍රම ලෙස සීට්ටු වැනි ක්‍රමයනුත් ගම්මානය තුළ දැකිය හැකිය. මෙම ගම්මානය දරිද්‍රතාවය අතින් ඉහළම තැනක් ගන්නා ගමක් බැවින් සමෘද්ධිලාභී පවුල් 94% ක්ම සිටීම තුළ ඔවුන් අනිවාර්යය ඉතුරුමකට පොළඹවා තිබේ. මෙම මුදල ද ඔවුනට අතට ලැබෙනුයේ නම් ඉතුරුම් නොවනු ඇත. මෙය විධිමත් ක්‍රමයන් ඔස්සේ එනම් සමෘද්ධි බැංකු සංගම් ජාලය තුළ ක්‍රියාත්මක වේ. ඒ තුළ ඔවුන්ටම කියා ගනුදෙනු කිරීමට කිසියම් නීති පද්ධතියක් ක්‍රියාත්මක වේ. මන්ද යත් දුප්පත්කම අතින් ඉහළම කණ්ඩායමකගේ ඉතුරුම් තවත් දුප්පත් පවුලකට ණයට ලබාදීමට යෑමේදී එහි අවධානම ඉතා ඉහළ පැවතීම නිසයි. ඒ තුළ කණ්ඩායම් ක්‍රම වැනි ක්‍රමයන් මගින් ඔවුන් ඒකරාශී කර ගනුදෙනු කිරීමට පොළඹවා තිබේ.

3.8 සංඛ්‍යා සටහන : මූල්‍ය ආයතන සමග ඉතිරි කිරීම, ගිණුම් ප්‍රමාණය සහ පවුල් සංඛ්‍යාව

| බැංකුවේ නම | ඉතිරි කරන පවුල් ගණන | ඉතුරුම් ගිණුම් | | ඉතිරි කරන පවුල් ගණන | ජංගම ගිණුම් | | ඉතිරි කරන පවුල් ගණන | ළමා ගිණුම් | | ඉතිරි කරන පවුල් ගණන | ස්ථාවර තැන්පතු | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % |
| මහජන බැංකුව | 4 | 4 | 5.7 | 2 | 2 | 28.6 | 4 | 5 | 10.2 | - | 1 | - |
| ලංකා බැංකුව | 9 | 13 | 18.6 | - | - | - | 5 | 6 | 12.2 | 1 | 3 | 4.5 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 9 | 10 | 14.3 | 1 | 2 | 28.6 | 1 | 3 | 6.1 | 2 | 1 | 13.6 |
| සමෘද්ධි බැංකුව | - | - | - | - | - | - | 1 | 01 | 2 | 1 | 15 | 4.5 |
| ග්‍රාමීය බැංකුව | 27 | 38 | 54.3 | 2 | 3 | 42.9 | 13 | 27 | 56.1 | 6 | - | 68.2 |
| සණස බැංකුව | 2 | 3 | 4.3 | - | - | - | - | - | - | - | - | - |
| හැටන් නැෂනල් බැංකුව | - | - | - | - | - | - | 1 | 1 | 2 | - | 2 | - |
| සෙලාන් බැංකුව | 1 | 1 | 1.4 | - | - | - | 2 | 6 | 12.2 | 1 | - | 9.1 |
| සම්පත් බැංකුව | 1 | 1 | 1.4 | - | - | - | - | - | - | - | 22 | - |
| එකතුව | 53 | 70 | 100 | 5 | 7 | 100 | 27 | 49 | 100 | 11 | 44 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානය තුළ පවතින මුළු ගිණුම් ප්‍රමාණය 137 ක් වන අතර මෙහි ඇති විශේෂත්වය නම් සෑම ගිණුම් වර්ගයකම ඉහළ දායකත්වයක් ප්‍රදේශයේ සමුපකාර ග්‍රාමීය බැංකු තුළ පැවතීමයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ එය ඇලපාත ප්‍රදේශය තුළ පිහිටා තිබීම සහ ග්‍රාමීය ප්‍රදේශයන්හි බොහොමයක් ගනුදෙනු ඒ හරහා සිදුවීමත්ය. එසේම ඉතුරුම් ගිණුම් පවත්වන සංඛ්‍යාව 53 ක් වන අතර ඔවුන් සතු ඉතුරුම් ගිණුම් ගණන 70 කි. මේ ආකාරයේ විධිමත් ආයතනවල මෙන්ම අවිධිමත් ආකාරයේ ඉතුරුම් ද දැකිය හැකිවිය. 3.9 සංඛ්‍යා සටහනින් 2000 වසරෙන් පසු ගම්මානයේ සීට්ටු දැමීම සිදු කරන්නන් සම්බන්ධ තොරතුරු දැක්වේ.

3.9 සංඛ්‍යා සටහන : ගම්මානයේ සීට්ටු දැමීම සිදුකරන පවුල් ගණන

| සීට්ටු දැමීම | සංඛ්‍යාව | % |
|---|---|---|
| ඔව් | 30 | 61 |
| නැත | 19 | 39 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

3.10 සංඛ්‍යා සටහන : සීට්ටු දැමීම සිදුකළ වාර ගණන (2000 වසර සිට)

| වාර ගණන | සංඛ්‍යාව | % |
|---|---|---|
| 1-5 අතර | 29 | 98 |
| 6-10 අතර | 01 | 02 |
| එකතුව | 30 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

මෙම සටහන තුළින් පෙනීයනුයේ ගම්මානය තුළ තව දුරටත් පවතින අවිධිමත් ඉතුරුම් භාවිතය වේ. එනම් ග්‍රාමීය ප්‍රදේශයන්හි බහුලව සීට්ටු ක්‍රමය දැකිය හැකි අතර එය මෙම ගම්මානයේද 61% ක් පමණ භාවිත කරනු ලබයි.

### 3.7 ණයගැති භාවය

ගමෙහි පවුල්වලට තම වියදමට ප්‍රමාණවත් ආදායමක් නොලැබීම නිසා තම දෛනික කටයුතු සඳහා මෙන්ම නිවාස ප්‍රශ්නයට තාවකාලික හෝ විසඳුම් ලබාගැනීම සඳහා පවුල් 43 ක් පමණ දැනට ණය ලබාගෙන ඇත. මොවුන් සියලුදෙනා ණය ලබාගෙන ඇති මාර්ග පිළිබඳ විශ්ලේෂණයේදී අපට දැකගත හැකි වූයේ එම මූලයන් ග්‍රාමීය ක්ෂේත්‍රයට පමණක් ආවේණික වූ අංග බවයි. එනම් ප්‍රධාන පෙලේ කිසිදු රාජ්‍ය හෝ පෞද්ගලික බැංකුවකින් ණය ලබාගැනීමක් සිදුවී නොමැත. එයට හේතුව ලෙස දැකිය හැක්කේ එම ආයතනවලින් ණය ලබා ගැනීමට නම් ප්‍රමාණවත් ඇපයක් තැබීම හෝ තම වත්කමක් පැවතීම සහ රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ ස්ථිර සේවකයෙකු වීම අනිවාර්යය බවයි. එනම් අඩු ආදායම්ලාභී පවුල් සඳහා ණය ලබා දීමේදී පවතින ඉහළ අවධානම් තත්ත්වයයි. බැංකුවක් ණයක් ලබාදීමේදී අවධානම් සංකල්පය අතිශය වැදගත්කොට සළකනුයේ ණය මුදල ආපසු ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම නිසයි. නැතිනම් ප්‍රමාණවත් ඇපයක් තැබිය යුතුවීමයි. නමුත් ගම්මානය තුළ එසේ ණය ලබාගැනීම් දැකිය නොහැකි අතර ග්‍රාමීය අංශය තුළ ඇති මූල්‍ය ආයතනවලින් සුළු වශයෙන් ණය ලබාගැනීම් දැකිය හැකිවිය.

3.11 සංඛ්‍යා සටහන : ණය ලබාගැනීම්වල ස්වරූපය

| ණය ලබාගත් ආයතනය | පවුල් | | මුළු ණය ප්‍රමාණය | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | ප්‍රමාණය | % |
| සමෘද්ධි බැංකුව | 3 | 7 | 20,000 | 8.7 |
| සණස බැංකුව | 1 | 2.3 | 25,000 | 10.8 |
| හිතවතුන්ගෙන් | 34 | 79.1 | 96,600 | 41.9 |
| නිවාස සංවර්ධන අධිකාරිය | 5 | 11.6 | 89,000 | 38.6 |
| එකතුව | 43 | 100 | 230,600 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ණය ලබාගෙන ඇති මූලාශ්‍රයන් විග්‍රහ කිරීමේදී පැහැදිලි වන ප්‍රධාන කරුණක් වනුයේ 79% ක්ම හිතවතුන්ගෙන් ණය ලබාගෙන තිබීම වන අතර එය විශේෂයෙන්ම කෘෂිකාර්මික සහ කෘෂි කාර්මික නොවන කම්කරුවන් ඔවුන් සේවය කරන ස්ථානයෙන් ලබාගත් ණය බව නිරීක්ෂණය විය. විශේෂයෙන් තේ දළු නෙළන කෘෂි කම්කරු මෙන්ම මැණික් පතල් ආශ්‍රිතව වැඩ කරන කෘෂි නොවන කම්කරුවන් ඔවුන් සේවය කරන අයගෙන් ලබාගත් ණය මේ අතර ප්‍රධාන වේ. ණය ලබා ගැනීම් මාර්ග ඉහත වගුවෙන් දැකගත හැකි අතර 80% ක් පමණ හිතවතුන්ගෙන් ණය ලබාගෙන ඇති අතර මේවා සඳහා පොලියක් නොමැති බව දැක්විය. සමෘද්ධි බැංකුව සහ නිවාස සංවර්ධන අධිකාරිය තුළින් 19% ක් පමණ ණය ගෙන ඇති අතර සමෘද්ධි බැංකුව 8% ක් වැනි පොලියක් වාර්ෂිකව අය කරනු ලබයි. මෙයට අමතරව ප්‍රදේශයේ සහනදායී පොලියට ණය ලබාගත හැකි වෙනත් කිසිදු ආයතනයක් හෝ මාර්ගයක් නොමැති බව දැකගත හැකිවිය. එවැනි ආයතනයක් පිහිටුවා ගැනීමට තරම් ගම්මානයේ සාමාජීය වෙනස්වීමක් මෙතෙක් සිදුවී නොමැති අතර ගම්මානය අවට කුලීවැඩ කරන අයගෙන් ණය ලබාගැනීමට ඇති හැකියාව මත එවැනි අවශ්‍යතාවයක් පැනනැගී නොමැත.

3.12 සංඛ්‍යා සටහන : ගම්මානයේ ණය ලබාගැනීම්

| ණය මුදල් පරාසය (රු.) | ණය ලබාගත් සංඛ්‍යාව | මුළු ණය මුදල් (රු) | % |
|---|---|---|---|
| 1000 ට අඩු | 8 | 3400 | 1.5 |
| 1000-2000 අතර | 10 | 12,800 | 5.6 |
| 2000-3000 අතර | 10 | 28,400 | 12.3 |
| 5000- 7500 අතර | 07 | 38,000 | 16.5 |
| 10,000-20,000 අතර | 05 | 70,000 | 30.4 |
| 20,000-50,000 අතර | 03 | 78,000 | 33.8 |
| එකතුව | 43 | 230,600 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානයේ ණය ගැතියන් ප්‍රමාණය සළකා බැලිමේදී රු. 5,000 ට වඩා අඩු ණය ලබාගත් පිරිස 28 (65%) ක් පමණ වේ. රු. 5,000 -50,000 අතර ණය ලබාගෙන ඇති පුද්ගලයින් සංඛ්‍යාව 15 ක් වේ. එනම් මෙහිදීද පෙනී යනුයේ ණය ලබාගැනීමේදී පවුල්වල තත්ත්වය මත ඉහළ ණයක් ලබාගැනීමට ඇති හැකියාව අවම තත්ත්වයක පවතින බවයි.

3.13 සංඛ්‍යා සටහන : ණය ලබාගැනීමට හේතු

| ණය ලබා ගැනීමට හේතු | ණය ලබාගත් සංඛ්‍යාව | % |
|---|---|---|
| නිවාස සෑදීමට/අළුත් වැඩියා කිරීමට | 7 | 16.3 |
| අසනීප වීම නිසා | 14 | 32.6 |
| පෞද්ගලික අවශ්‍යතාවක් නිසා | 1 | 2.3 |
| මංගල උත්සව සඳහා | 1 | 2.3 |
| පරිභෝජනය සඳහා | 20 | 46.5 |
| එකතුව | 43 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කෝ.ගො.ප. හා පු. ආයතනය

ණය ලබාගැනීමට ප්‍රධානම හේතුව වී ඇත්තේ පහළ ජීවන මට්ටම බව ඉහත සටහන තුළින් අවබෝධකරගත හැකිය. එනම් 47% ක් පමණම පරිභෝනය සඳහා ණය ලබාගෙන ඇති අතර 33%ක්ම අසනීප තත්ත්වයන් නිසා ණය ලබාගෙන පැවතීමත්ය. මෙම කරුණු දෙකම අඩු ජීවන තත්ත්වය සමග බැඳී පවතින ඒ තුළ ඇතිවන ප්‍රතිඵලයක් වේ.

එසේම අනෙක් ප්‍රධාන කරුණ නම් ලබාගත් ණය නොගෙවීමට හේතුව ලෙස 100% ක්ම පෙන්වා දී ඇති කරුණ නම් තමන්ට පවතින ආර්ථික අපහසුතාවන්ය.

# හතරවන පරිච්ඡේදය

# නිවාස තත්ත්වය සහ පහසුකම්

## 4.1 නිවාස අයිතිය

ගම්වාසීන්ගේ සමාජ ආර්ථික තත්ත්වය මැන බලන තවත් එක් ප්‍රධාන නිර්ණායකයක් ලෙස තම ජීවත්වන නිවාසයන්හි තත්ත්වය සහ ඒවායේ ඇති පහසුකම් සළකා බැලිය හැකිය. සමාජ ආර්ථිකමය තත්ත්වයෙන් පහළ මට්ටමක පවතින මෙම ගම්මානයේ ජීවත්වන මුළු පවුල් සංඛ්‍යාව 49 ක් වන අතර ඔවුන්ගෙන් 92% ක් එනම් පවුල් 45 දෙනෙකුම නිවාසයන්හි තනි අයිතිය ඇති අතර ඉතිරි පවුල් 04 හවුල් අයිතිය තුළ ජීවත් වේ. එසේම මෙම ගම්මානය කුඩා වපසරියකින් යුත් භූමි ප්‍රමාණයක මෙන්ම කඳු ශිකර සහිත පරිසරයක පිහිටා තිබීම මත නිවාස පිහිටා ඇති දුර ප්‍රමාණයද එතරම් ව්‍යාප්ත වී නොමැත.

## 4.2 නිවාස තත්ත්වය

ක්ෂේත්‍ර සමීක්ෂණයට අනුව ස්ථිර නිවාස 18 ක් සහ අර්ධ ස්ථිර නිවාස 29 ක් ඇති අතර ඉතිරි නිවාස තාවකාලික තත්ත්වයේ පවතින බව හඳුනාගත හැකි විය. ගම්මානය තුළ පවතින පහළ ජීවන මට්ටම මත මේ ආකාරයේ නිවාස පැවතීම දැකිය හැකි අතර ඒවායේ තත්ත්වයන් පිළිබඳ පහත සංඛ්‍යා සටහන තුළින් අවබෝධ කරගත හැකිය.

4.1 සංඛ්‍යා සටහන : ගම්මානයේ නිවාසවල විශාලත්වය

| නිවාසවල ප්‍රමාණය (වර්ග අඩි) | නිවාස ප්‍රමාණය | % |
|---|---|---|
| 100 ට අඩු | 2 | 4.1 |
| 100- 250 අතර | 9 | 18.4 |
| 250-500 අතර | 22 | 44.9 |
| 500-750 අතර | 10 | 20.4 |
| 750- 1000 අතර | 6 | 12.2 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගමෙහි නිවාසවලින් 45% ක්ම වර්ග අඩි 250-500 අතර නිවාස වන අතර නිවාස 39 ක් එනම් 85%ක් පමණ වර්ග අඩි 100-750 අතර ප්‍රමාණයකින් පිහිටා තිබේ. මෙම ගම්මානය තුළ මුළු වපසරිය අක්කර 13 1/2 වන අතර ඒ තුළ එක් පුද්ගලයකු සතු ඉඩම් ප්‍රමාණයද කුඩා කොටසක් වීම මෙන්ම පහත් ආර්ථික තත්ත්වය නිවාසයන්හි තත්ත්වය සඳහා හේතු වී තිබේ.

මෙම නිවාසයන්හි වහල, බිත්ති සහ ගෙබිම තත්ත්වය අනුව කුමන තත්ත්වයක පවතීද යන්න පහත සටහන් තුළින් දැකගත හැකිය.

4.2 සංඛ්‍යා සටහන : නිවාසවල තත්ත්වය - වහලයේ ස්වභාවය

| වහලයේ ස්වභාවය | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| උළු | 41 | 83.7 |
| ටකරන් | 06 | 12.2 |
| පොල්අතු | 02 | 4.1 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ඉහත සංඛ්‍යා සටහන අනුව නිවාසයන්හි වහලවල 84% ක් පමණ උළු සෙවිලිකර තිබීම දැකිය හැකිවිය. 12.2% ක් පමණ ටකරන් සෙවිලිකර ඇති අතර එම ද්‍රව්‍යයන් ද බොහොමයක් රජයේ සහනාධාර මත ලද ඒවා බව ද අනාවරණය විය.

4.3 සංඛ්‍යා සටහන : නිවාසවල තත්ත්වය - බිත්තිවල ස්වභාවය

| බිත්තියේ ස්වභාවය | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| සිමෙන්ති ගල් | 29 | 59.2 |
| වෙනත් ගල් | 10 | 20.4 |
| වරිච්චි | 10 | 20.4 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානයේ නිවාසයන්ගෙන් 29ක් එනම් 59% ක්ම සිමෙන්ති ගල් හා ගඩොල් භාවිත කර ගොඩනගා ඇති අතර මේවා ද බොහොමයක් කපරාරු කර නොමැත. අවම තරමින් සිමෙන්ති ගල්වලින් නිවාසය ගොඩනගාගෙන ඇති අතර එම නිවෙස්වලද ගෙබිම ගොම මැටි අතුරා තිබීම දක්නට හැකිවිය. කබොක් ගල් මිශ්‍රව ගොඩනගා ඇති නිවාස 10 ක්ද කටුමැටි වරිච්චි තත්ත්වයේ බිත්ති සහිත නිවාසද 10 ක්ද ගම්මානයේ වේ.

4.4 සංඛ්‍යා සටහන : නිවාසවල තත්ත්වය - බිම් ස්වභාවය

| බිමෙහි ස්වභාවය | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| සිමෙන්ති | 22 | 44.9 |
| බිම් ගඩොල් (ටයිල්) | 01 | 2.0 |
| ගොම මැටි | 26 | 53.1 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගමෙහි නිවාසවලින් 53% ක (නිවාස 26) ගෙබිම ගොම මැටි අතුරා තිබේ. නිවාස 22 ක් එනම් 45% පමණ සිමෙන්ති අතුරා තිබීම දැකිය හැකි වුව බොහොමයක් නිවාසයන්හි එක් කාමරයක් හෝ සාලය කොටස පමණක්



පුස්තකාලය
LIBRARY
හෙ.කො.ගො.ප.පු.ආ
HARTI

සිමෙන්ති දමා තිබීමද දක්නට හැකිවිය. බිම් ගඩොල් (Tile) අතුරා ඇති නිවාසයේ ද විසිත්ත කාමරයේ පමණක් අතුරා තිබීම දැකිය හැකිවිය.

මේ ආකාරයට ගම්මානයේ නිවාසයන්හි වහලය, ගෙබිම මෙන්ම බිත්තිවල ස්වභාවය දැක්විය හැකි අතර මේවා බොහොමයක් කුඩා තත්ත්වයේ නිවාසවීමද පහළ ජීවන මට්ටම කියාපෑම පෙන්නුම් කරයි. නිවාසවල පවත්නා කාමර ප්‍රමාණයන් පහත සටහන තුලින් හඳුනාගත හැකිය.

4.5 සංඛ්‍යා සටහන : නිවාසයන්හි කාමර ප්‍රමාණය අනුව නිවාස සංඛ්‍යාව

| කාමර ගණන | ප්‍රමාණය | % |
|---|---|---|
| 1 | 14 | 28.6 |
| 2 | 26 | 53.1 |
| 3 | 05 | 10.1 |
| 4 | 03 | 6.1 |
| 5 | 01 | 2.0 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානයේ නිවාසවල 82%ක් පමණ කාමර දෙකක් හෝ එයට අඩු තත්ත්වයේ පවතින නිවාස වේ. කාමර 05 ක් ඇති නිවාස 01 ක් පමණක් ගමෙහි ඇත.

4.6. සංඛ්‍යා සටහන : නිවාසවල මුළුතැන්ගෙයි පිහිටීම

| පිහිටා ඇති ආකාරය | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| ගෙයින් පිටත වෙනම | 10 | 20.4 |
| ගෙයතුළ වෙනම කාමරයක් | 26 | 53.1 |
| ගෙයතුළ වෙනම වෙන් නොවූ කාමරයක | 13 | 26.5 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

මෙම නිවාසවලින් 53% ක (නිවාස 26) ගෙයතුළම එක් කාමරයක් ද 26.5% (නිවාස 13) ගෙයතුළ වෙන් නොවූ කාමරයක 26.5% ක් එනම් නිවාස 13 ක් ගෙයතුළ වෙන් නොවූ කාමරයක් ද මුළුතැන්ගෙය ලෙස භාවිත කිරීම දැකිය හැකිවිය. ගෙයින් පිටත වෙනම නිවාස 10 ක් ලෙස මුළුතැන්ගෙය භාවිතා කිරීමද දැකිය හැකි වූ අතර මොවුන් බොහොයක් තම අළුතින් සාදන නිවාස අසල ඇති පැරණි නිවස මෙසේ මුළුතැන්ගෙය ලෙස භාවිතා කිරීම දැකිය හැකිවිය.

4.3 නිවාසවලට ඇති පහසුකම්

නිවාසවලට ඇති පහසුකම් සළකා බැලීමේදි ඒවා සඳහා මෝටර් රථයකින් පිවිසීමට ඇති හැකියාව කොතෙක්ද යන්න සහ තම නිවාසවලට දුරකථන පහසුකම් පවතීද යන්න පිළිබඳව සළකා බැලිය හැකිය. මෙම ගම්මානය පෙර සඳහන් කළ ආකාරයටම කඳු ශිකර මෙන්ම තද බෑවුම් සහිත බැවින් ගම්මානයට පිවිසීමට නිසි ප්‍රවේශ මාර්ගයක් හෝ නොමැති ගම්මානයකි. ගම්මානයේම පවතින නිවාස 49 තුළින් එක් නිවසකට පමණක් මෝටර් රථයකින් ප්‍රවේශවීමට හැකියාව පවතී. එම නිවසද ගම්මානයට පවිසෙන ආසන්නයේම පිහිටා තිබීම එයට හේතුවයි. ඉතිරි නිවාස 48 සඳහා පාපැදියකින් හෝ රැගෙන යාමට නොහැක. වාහනයකින් පිවිසීමට නොහැකි වීම පිළිබඳව 92%ක්ම පෙන්වා දී ඇත්තේ තමන්ට ඒ සඳහා පාරක් නොමැති බවයි.

තම නිවසේ සිට මෝටර් රථයකින් පිවිසීමට පාරට ඇති ආසන්නම දුර ප්‍රමාණය 4.7 සංඛ්‍යා සටහන තුළින් දැකගත හැකිය.

4.7 සංඛ්‍යා සටහන : මෝටර් රථයකින් යාහැකි පාරට ඇති ආසන්නම දුර

| ආසන්නම දුර (මීටර්) | ප්‍රමාණය | % |
|---|---|---|
| 50 ට අඩු | 01 | 2.1 |
| 50-100 අතර | 0 | 0 |
| 100-250 අතර | 01 | 2.1 |
| 250-500 අතර | 02 | 4.2 |
| 500-750 අතර | 19 | 39.6 |
| 750- 1000 අතර | 14 | 29.2 |
| 1000 ට වැඩි | 11 | 22.9 |
| එකතුව | 48 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

මෙම නිවාස සඳහා මෝටර් රථයකින් යාහැකි පාරට අති ආසන්නම දුර ප්‍රමාණය ඉහත සටහන තුළින් දැක්වෙන අතර එහි ඇති විශේෂත්වය ගෙවල් 44කටම මීටර් 500 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් පාගමනින් යාමට වන බව සඳහන් කර තිබීමයි.

ගම්මානයේ රැහැන් සහිත දුරකථන හෝ රැහැන් රහිත ස්ථිර දුරකථන කිසිවක් නොමැත. පවුල් 49න් 07(14.3%) කට පමණක් ජංගම දුරකථන පහසුකම් පවතී.

4.4 බලශක්ති භාවිතය සඳහා පහසුකම්

බලශක්ති භාවිතය සඳහා ඇති පහසුකම් සළකා බැලීමේදී ගමේ සියළුම පවුල් තම ආහාර පිසීම සඳහා ප්‍රධාන වශයෙන්ම දර භාවිත කිරීම දැකිය හැකිවිය. එනම් ඒ සඳහා ඔවුන්ට කිසිදු පිරිවැයක් නොමැති අතර අවශ්‍ය

ප්‍රමාණයට ලබාගැනීමට හැකියාව පවතී. එසේම ගෑස් වැනි වෙනත් බලශක්ති ප්‍රභවයන් භාවිතා කිරීමට හෝ විදුලිය ප්‍රමාණවත් පරිදි ගම්මානයේ ව්‍යාප්තව නොමැති වීම මත විදුලි බලයද ඔවුන්ගේ අඩු ජීවන රටාව තුළ මෙසේ යොදා ගැනීමට හැකියාවක් නොමැත.

සම්පූර්ණ ගම්මානය තුළ විදුලිබලය මෙතෙක් ව්‍යාප්තවී නොමැති අතර පවුල් තිස්හතරකටම එනම් (70%) පමණ විදුලි බලය නොමැති අතර පවුල් 15ක් එනම් 30%ක් පමණ විදුලිය ලබාගෙන ඇත. කිසිදු නිවසක් "සූර්ය ශක්තිය" වැනි ප්‍රභවයන් භාවිතා නොකරයි. මෙම විදුලි බලය නොමැති නිවාස 34 තුළින් 32ක්ම පෙන්වා දී ඇත්තේ ප්‍රදේශයට විදුලිබලය නොමැතිවීම මත තමන් විදුලි බලය ලබාගෙන නොමැති බවයි. නිවාස 02 ක් තම ආර්ථික අපහසුතා මත විදුලිය ලබා නොගෙන සිටින බවත් පැහැදිළි විය.

විදුලිය ලබා නොගැනීමට හේතුව ලෙස තම නිවසට ආසන්නම විදුලි කුවට ඇති දුර පිළිබඳ පහත සඳහන් තොරතුරු පෙන්වා දී තිබුණි. ඒ තුලින්ද දැකිය හැකි ලක්ෂණයක් නම් නිවාස වැඩි ප්‍රමාණයක් ආසන්න කණුවට වඩා වැඩි දුරකින් පිහිටා තිබීමයි.

4.8 සංඛ්‍යා සටහන : විදුලිය ලබා ගැනී සඳහා ඇති ආසන්නම දුර

| ආසන්නම දුර (මීටර්) | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| 0-25 අතර | 01 | 2.9 |
| 25-50 අතර | 03 | 8.8 |
| 50-100 අතර | 0 | 0 |
| 100-200 අතර | 07 | 20.6 |
| 200-400 අතර | 09 | 26.5 |
| 400-600 අතර | 03 | 8.8 |
| 600 ට වැඩි | 11 | 32.4 |
| එකතුව | 39 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

මේ තුලින් පෙනී යනුයේ නිවාස 30 ක් පමණම මීටර් 100 හෝ ඊට වඩා වැඩි ප්‍රමාණයන් අදාල කණුවේ සිට පිහිටා ඇති බවයි. විදුලිය නොමැති නිවාසවලින් 32% ක් පමණ, එනම් නිවාස 11 ක් මීටර් 600 ට වැඩි දුරින් පිහිටා ඇති බවත්ය.

4.9 සංඛ්‍යා සටහන : පානීය ජලය සපයා ගන්නා ආකාරය

| ජලය සපයාගන්නා ආකාරය | පවුල් ගණන | % |
|---|---|---|
| තමාගේ ළිඳෙන් | 7 | 14.3 |
| අසල්වැසි ළිඳෙන් | 42 | 85.7 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානයේ සැළකිය යුතු පිරිසක් එනම් පවුල් 42 (86%) ක් පානීය ජලය සපයා ගනුයේ අසල්වැසි ළිංවලින් වීම මෙම ගමෙහි විශේෂත්වයකි. ඉතා සුළු පිරිසක් තම ළිඳෙන් පානීය ජලය භාවිත කරනු ලබයි. මේ සඳහා බලපා ඇති හේතුවනනේ සෑම නිවසකටම ළිඳක් නොමැතිවීමත් ඒ සඳහා සුදුසු බිමක් නොතිබීමත්, තිබූ පමණිනම එහි ජලය පානීය තත්ත්වයට ලබාගත නොහැකිවීමත්ය. විශේෂයෙන්ම ළිඳක් සැකසීම සඳහා සදුසු තත්ත්වයේ බිමක් (කදු නිසා) බොහොමයක් නිවාස සඳහා නොමැත.

මෙම ගම්මානයේ කිසිදු නිවාසයකට නළ ජලය ලබාගෙන නොමැත. පානීය ජලය පිළිබඳ සැළකිමේදී වැසි කාලයේදී වෙනත් අසල්වැසි ළිං වෙත යාමට පවත්නා දුර පහත ලෙස දැකිය හැකි විය.

4.10 සංඛ්‍යා සටහන : පානීය ජලය ලබාගැනීම සඳහා වැසි කාලයේදී අසල්වැසි නිවසට යාම සඳහා පවතින දුර

| පවත්නා දුර ප්‍රමාණය (කි.මී) | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| 0-1/4 අතර | 33 | 78.6 |
| 1/4-1/2 අතර | 08 | 19.0 |
| 1/2-3/4 අතර | 01 | 2.4 |
| එකතුව | 42 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

නිරන්තර වර්ෂා සහිත ප්‍රදේශයක වුව පානීය ජලය ලබා ගැනීම සඳහා ගම්මානයේ පවුල් 33 ක් එනම් 79% ක් පමණ කි.මී. 1/4 හෝ ඊට ආසන්න ප්‍රමාණයක් පයින් යා යුතු බව මේ තුළින් පැහැදිලි වේ. කෙසේ වුව මෙම තත්ත්වය වැසි නොමැති කාලවලදී එතරම් වෙනසක් නොවන බව පහත සටහනින් දැකිය හැකිය. එසේම මෙහිදී සඳහන් කළයුතු එක් සුවිශේෂී කරුණක් නම් මෙම ප්‍රදේශය සඳහා වැසි නොමැති කාලයන් ලෙස වෙන්කොට හඳුනාගත හැකි කාල වකවානුවක් නිශ්චිතව දැකිය නොහැකි වීමයි. මන්ද මෙම ප්‍රදේශය සිංහරාජ වනාන්තරයට ඉතා ආසන්න ප්‍රදේශයක පිහිටා තිබීම නිසා නිරන්තර වැසි ලැබෙන ප්‍රදේශයක් වීමයි.

4.11 සංඛ්‍යා සටහන : පායන කාලවලදී පානීය ජලය ලබාගැනීමට යායුතු දුර ප්‍රමාණය

| දුර ප්‍රමාණය (කි.මී.) | පවුල් සංඛ්‍යාව | % |
|---|---|---|
| 0-1/4 අතර | 29 | 65.9 |
| 1/4-1/2 අතර | 06 | 13.6 |
| 1/2-3/4 අතර | 04 | 9.1 |
| 3/4-1 අතර | 05 | 11.4 |
| එකතුව | 44 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

පායන කාලයේදී කි.මී. 0-1/4 අතර ප්‍රමාණයක් වැසි කාලයට සාපේක්ෂව යම් අඩුවීමක් දැකිය හැකිය. එනම් ඔවුන් ඊට වඩා වැඩි දුරක් ඒ සඳහා ගමන් කළයුතු වීම නිසා වේ.

ගම්මානය තුළ පානීය ජලයේ තත්ත්වය පිළිබඳව විමසා බැලීමේදී ඒවායේ තත්ත්වය පිළිබඳ අදහස වැසි කාලයේදී සහ වැසි නොමැති කාලයේදී එතරම් සැළකිය යුතු වෙනසක් නොවන බව පහත සටහන තුළින් පැහැදිලි වේ.

4.12 සංඛ්‍යා සටහන : බීමට ලබාගන්නා ජලයේ තත්ත්වය

| ජලයේ තත්ත්වය | වැසි කාලයේදී | | වියලි කාලයේදී | |
|---|---|---|---|---|
| | පවුල් සංඛ්‍යාව | % | පවුල් සංඛ්‍යාව | % |
| සතුටුදායකයි | 14 | 28.6 | 12 | 24.5 |
| අසතුටුදායකයි | 35 | 71.4 | 37 | 75.5 |
| එකතුව | 49 | 100 | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

පානීය ජලය පිළිබඳ මත විමසීමේදී එහි සැලකිය යුතු වෙනසක් කාල වකවානු දෙක තුළ දැකිය නොහැකි වනුයේ පෙර සඳහන් කළ පරිදි මෙම කාල වකවානු නිශ්චිතව හඳුනාගත නොහැකි වීමයි. එනම් බොහෝවිට වර්ෂය පුරාම එකසේ වර්ෂාපතනයක් පැවතීමයි.

කෙසේ වුව තම පානීය ජලය පිළිබඳ ගැමියන්ගේ අදහස අනුව ඔවුන්ට පිරිසිදු ජලය නොලැබෙන අතර පහත සඳහන් යෝජනා ඒ සඳහා පෙන්වා දී ඇත.

4.13 සංඛ්‍යා සටහන : බීමට සුදුසු ජලය ලබාගැනීම සඳහා කරන යෝජනා

| ඉදිරිපත් කරන යෝජනා | පවුල් ගණන | % |
|---|---|---|
| පානීය ජල ව්‍යාපෘතියක් ඇති කිරීම (නල ජලය) | 34 | 75 |
| පොදු ළිඳක් සකස් කිරීම | 11 | 25 |
| එකතුව | 45 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

පානීය ජලය ලබාගැනීම සඳහා ජල ව්‍යාපෘතියක් ඇති කිරීමට 75% ක් පමණ යෝජනා කර ඇත. මෙය ප්‍රායෝගිකව කිරීමට පහසු තත්ත්වයක් ලෙස ද දැකගත හැකිවිය. මන්ද ඒ සඳහා අවශ්‍ය ජල මූලාශ්‍ර පැවතීමත් ගම්මානයේ පිහිටීම අනුව නල ජලය ලබාදීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම පහසු බවත් නිසාය.

## 4.5 වැසිකිළි පහසුකම්

ගම්මානයේ සනිපාරක්ෂක තත්ත්වය පිළිබඳ සළකා බැලීමේදී වැසිකිළි පහසුකම් පිළිබඳව අධ්‍යයනය කිරීම අත්‍යාවශ්‍ය තත්ත්වයකි. මෙම ගම්මානයේ පවුල් 03 ක් සඳහා වැසිකිළි නොමැති අතර ඉතිරි පවුල් සඳහා පවතින වැසිකිළිවල ස්වභාවය පහත පරිදි වේ.

4.14 සංඛ්‍යා සටහන : වැසිකිළි පහසුකම් හා ඒවායේ ස්වරූපය

| වැසිකිළිවල ස්වරූපය | පවුල් ප්‍රමාණය | % |
|---|---|---|
| ජල මුද්‍රිත | 17 | 34.7 |
| තාවකාලික වල | 04 | 8.2 |
| වල වැසිකිළිය | 25 | 51.0 |
| වැසිකිළි නොමැති | 03 | 6.1 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානයේ සමාජීය ආර්ථික තත්ත්වය පෙන්නුම් කරන තවත් එක් දර්ශකයක් ලෙස මෙය දැක්විය හැකි අතර පවුල් 25 ක් එනම් 51% ක් පමණ තවමත් සාම්ප්‍රදායික වල වැසිකිළිය භාවිතා කරන අතර තාවකාලික වල භාවිතා කරන පවුල් 8.2% ද සිටින බව පැහැදිලි වේ. සනීපාරක්ෂක තත්ත්වය අධ්‍යයනයේදී මෙම තත්ත්වය සැළකිල්ලට ගතයුතු අංගයක් වේ.

## 4.6 නිවාසවල ඇති ගෘහ උපකරණ හා බඩු බාහිරාදිය

ගම්මානය තුළ ඇති සියළු නිවාසයන්හි ඇති ගෘහ උපකරණ සහ භාණ්ඩ පිළිබඳව පහත දැක්වෙන සටහන තුළින් තවත් එක් සමාජමය පැතිකඩක් අවබෝධකරගත හැකය. ඒ තුළ ඇති විශේෂත්වය නම් මෙම ගම්මානයේ එකදු පරිගණකයක්, විදුලි පංකාවක් හෝ රයිස් කුකරයක් හෝ නොමැති ගම්මානයක් වීමයි.

4.15 සංඛ්‍යා සටහන : නිවෙස්වල ඇති ගෘහ භාණ්ඩ හා විදුලි උපකරණ

| වර්ගය | සියළු උපකරණ | |
|---|---|---|
| | ප්‍රමාණය | % |
| ඔරලෝසු (අත් ඔරලෝසු හැර) | 47 | 21.6 |
| පැට්‍රල් ලාම්පු | 08 | 4.1 |
| රේඩියෝ | 36 | 18.6 |
| කැසට් රේඩියෝ | 30 | 15.5 |
| රූපවාහිනී යන්ත්‍ර | 26 | 13.4 |
| අල්මාරි | 16 | 7.7 |
| පුටු කට්ටල | 32 | 11.9 |
| ශීතකරණ | 02 | 1.0 |
| වී.සී.ඩී./ඩී.වී.ඩී. | 04 | 2.1 |
| මහන මැෂින් | 06 | 3.1 |
| පරිගණක | 01 | 0.5 |
| ගෑස් ලිප් | 01 | 0.5 |
| රයිස් කුකර් | - | - |
| විදුලි පංකා | - | - |
| ගෘහස්ත වතුර පොම්ප | - | - |
| එකතුව | 209 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානය තුළ කුඩා ප්‍රමාණයේ ශීතකරණ 02 ක් පමණක් ඇති අතර නිවාස 47 කම බිත්ති ඔරලෝසු දැකිය හැකිවිය.

### 4.7 ගමනාගමනය හා ප්‍රවාහනය සඳහා ඇති වාහන අයිතිය

ගමනාගමනය හා ප්‍රවාහනය සඳහා ගම්මානය තුළ තමන්ට හිමිකම් කියන බයිසිකල් 05 ක් සහ යතුරුපැදි 02ක් පමණක් ඇති අතර වෙනත් කිසිදු ප්‍රවාහන හිමිකමක් ඔවුන්ට නොමැත.

### 4.8 කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍ර සූත්‍ර

කිසිදු ආකාරයේ කෘෂිකාර්මික හිමිකමක් නොකියන මෙම ගම්මානය තුළ නිවාස 49න් 43 ක් තුළම උදලු පමණක්ම දැකිය හැකිවීම විශේෂ ලක්ෂණයකි. වෙනත් කිසිදු කෘෂිකාර්මික උපකරණයක් ඔවුන් සතුව නොමැත.

### 4.9 සෞඛ්‍ය තත්ත්වය

පසුගිය වසර දෙකක කාලය තුළ පවුලේ සාමාජිකයන්ට වැළඳුන් බෝවන රෝග පිළිබඳ විමසීමේදී එක් පුද්ගලයකුට පමණක් පාචනය රෝගය වැළඳී තිබූ බව හඳුනාගත හැකි වූ අතර වෙනත් කිසිදු රෝගී තත්ත්වයක් වාර්තා නොවීය.

එසේම ගම්මානයේ පවුල් 49 තුළ පානීය ජලය පුරුද්දක් වශයෙන් උණුකර පාවිච්චි කරන ප්‍රමාණය පවුල් 17 ක් වූ අතර ඉතිරි පවුල් 32 ම ජලය උණුකර පාවිච්චි නොකරයි. විශේෂයෙන්ම මේ සඳහා පුරුද්දක් නොමැතිවීම මේ සඳහා හේතු වී ඇත.

පවුලේ සාමාජිකයන් නිතර පළතුරු අනුභව කරන්නේ ද යන්න විමසීමේදී පවුල් 31 ක් එනම් 62% ක් අනුභව නොකරන බවත් ඉතිරි පවුල් 18 පළතුරු අනුභව කරන බවත් පැහැදිළි විය. මෙවන් තත්ත්වයට ඔවුන්ගේ පවුල්වල සමාජ ආර්ථික තත්ත්වය හේතුවී තිබේ.

ගම්වැසියන්ගේ සෞඛ්‍ය පුරුදු විමසීමේදී නිරීක්ෂණය වූයේ පවුල් 49 න් 44 ක්ම සාමාජිකයින් බුලත්විට කෑමට පුරුදු වී ඇති බවයි.

4.16 සංඛ්‍යා සටහන : ගම්මානය තුළ දුම්බීම, බුලත් විට සහ මත්පැන් භාවිතය

| අයහපත් සෞඛ්‍ය පුරුදු | පවුල් ගණන | සාමාජිකයන් සංඛ්‍යාව |
|---|---|---|
| බුලත්විට කෑම | 44 | 70 |
| දුම්වැටි භාවිතය | 20 | 20 |
| මත්පැන් භාවිතය | 10 | 10 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

මෙහි දැකගතහැකි විශේෂත්වය නම් පවුල් 10ක සාමාජිකයින් පමණක් මත්පැන් පානය කිරීමත් පවුල් 20ක සාමාජිකයන් දුම්වැටි භාවිතය කිරීමත්ය. එසේම මත්පැන් පානය කරන්නන්ම දුම්වැටි භාවිතය කරීමත් මෙහිදී දැකගත හැකිවිය. මෙම ගම්මානය තුළ පවතින අයහපත් පුරුදු නිසා සමාජයට ඇතිවන බලපෑම සැළකිය යුතු තත්ත්වයක් දැකීමට නොහැකි විය. මන්ද මොවුන් සමාජ ආර්ථිකමය අතින් පහළ තත්ත්වයක පැවතීමෙන් ඔවුන්ට එවැනි දේවල් සඳහා වියදම් කිරීමට මුදල් නොමැතිවීමයි.

4.17 සංඛ්‍යා සටහනේ සඳහන් ගමට අවශ්‍ය වැදගත් සේවා සපයන ආයතනවල පිහිටීම සහ ඒවාට ඇති දුර පිළිබඳ විමසීමේදී පෙනීයන ප්‍රධාන කරුණක් නම් මේ සියලු ආයතන ගමෙන් පිට පිහිටා තිබීමත් ඒවා සෑම එකක්ම අවම වශයෙන් කි.මී. 02 ක් හෝ ඊට වැඩි දුරක පිහිටීමත්ය.

4.17 සංඛ්‍යා සටහන : අවශ්‍ය වැදගත් සේවා සපයන ආයතනවලට ඇති දුර

| ආයතනයේ නම | ගම්මානයේ සිට ඇති දුර (කි.මී.) |
|---|---|
| ප්‍රාථමික පාසල (1-5 දක්වා පන්ති) | 02 |
| සා.පෙළ දක්වා ඇති පාසල (0-11/6-11) | 02 |
| උ.පෙළ කලා විෂයධාරා ඇති පාසල | 02 |
| උ.පෙළ විද්‍යා විෂයධාරා ඇති පාසල | 02 |
| සමුපකාර ප්‍රාදේශිකය | 02 |
| ගොවිජන සේවා මධ්‍යස්ථානය | 04 |
| පශු වෛද්‍ය කාර්යාලය | 10 |
| කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානය | 10 |
| තැපැල් හල | 2 1/4 |
| සමුපකාර බැංකුව | 02 |
| ලංකා බැංකුව/මහජන බැංකුව | 08 |
| ඩිස්පෙන්සරිය | 08 |
| රෝහල (නැවතීමේ ප්‍රතිකාර සහිත) | 10 |
| ආයුර්වේද ඩිස්පැන්සරිය | 11 |
| පුද්ගලික වෛද්‍යවරයා (බටහිර) | 06 |
| සතිපොළ | 02 |
| ආසන්නම බස්පාර | 02 |
| ආගමික ස්ථානය | 02 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානයේ ගමනාගමන හා වෙනත් සේවා යටිතල පහසුකම් පිළිබඳව පවතින දුරවල මට්ටම ඉහත සටහන තුළින් අවබෝධ කරගත හැක.

4.10 ගමනාගමනය හා සේවා යටිතල පහසුකම්

ගමෙහි ගමනාගමන හා සේවා යටිතල පහසුකම් පිළිබඳ විමසීමේදී මෙම තත්ත්වයන් ඉතාමත්ම පහත් තත්ත්වයක පවතින බව අවධාරණය විය. විශේෂයෙන්ම මෙම ගම්මානය තුළ තාර අතුරන ලද පාරවල් කිසිවක් නොමැති අතර කරත්ත පාරවල් ද කිසිවක් නොමැත. නමුත් තාර නොදමන ලද බොරළු පාරවල් ප්‍රමාණය කි.මී. 1 1/2 ක් පමණ වන බව හඳුනාගත හැකිවිය. ඇලපාත නගරයෙහි සිට කි.මී 4 1/2 ක් පමණ දුරින් පිහිටා ඇති මෙම ගම්මානයට පලාවෙල බසයෙන් ගමන්කර කි.මී. 02 ක් පමණ පයින් ගමන් කළයුතුව ඇත.

ගම්මානය තුළ විදුලි රැහැන්, දුරකථන රැහැන් ආදියෙන් ආවරණය නොවන අතර කුඩා වැව් හෝ අමුණු ද කිසිවක් නොමැත. එසේම ගම තුළ පිහිටා ඇති ප්‍රයෝජනයට ගතහැකි කිසිදු ගොඩනැගිල්ලක් ද නොමැති තත්ත්වයක් පැවතීමද විශේෂත්වයකි.



පුස්තකාලය
LIBRARY
ගො.කො.ගො.ප.පු.ආ
HARTI

# පස්වන පරිච්ඡේදය

# ඉඩම් අයිතිය බුක්තිය හා සංවර්ධනය කිරීම

## 5.1 බුක්ති විඳින ඉඩම්වල ස්වභාවය හා ප්‍රමාණය

ගමෙහි සෑම පවුලක්ම ඉතා සුළු ඉඩම් කොටසකට හිමිකම් කියන අතර එය අක්කර 1/4 කට වඩා අඩු භූමි ප්‍රමාණයකි. ගම්මානය තුළම මඩ ඉඩම් අක්කර 01 ක් පමණක් ඇති අතර වගා කටයුතු සඳහා ජෙන් ද නොමැත. ගොඩ ඉඩම් අක්කර 12 1/2 සියළු දෙනා අතර බෙදී පැවතිය ද මෙයින් ද සැළකිය යුතු ප්‍රමාණයක් ගල්පර සහ ලඳුකැළෑවලින් ගහණය.

ගම්වැසියන් බුක්ති විඳින ඉඩම් සියල්ල ග්‍රාම සේවා වසම තුළ පමණක් පිහිටා ඇති අතර ඒවා ඔවුන්ගේ ගෙවත්ත ලෙස හඳුනාගත හැක. එසේම මෙයින් තනි අයිතිය 90% ක්ම වන අතර ඉතිරිය හවුල් අයිතිය වේ.

## 5.2 බුක්ති විඳින ඉඩම්වල අයිතිය හා බුක්තියේ ස්වභාවය

ගම්මානය තුළ පවතින මුළු ඉඩම් අක්කර 13 1/2 ප්‍රමාණය මඩ ඉඩම් අක්කර එකකින් සහ ගොඩ ඉඩම් අක්කර 12 1/2 න් සමන්විත වන අතර මින් අක්කර 10 1/2 ක් ප්‍රමාණයක් බුක්ති විඳින මුළු ඉඩම් ප්‍රමාණය ලෙස හඳුනාගත හැකිය. මඩ ඉඩම් අක්කර 01 ක ප්‍රමාණය පවුල් 02 ක් පමණක් බුක්ති විඳින අතර ගොඩ ඉඩම් සියල්ල එක් පවුලකට අක්කර 1/4 හෝ ඊට අඩු ප්‍රමාණයක් ලෙස බෙදීගොස් ඇති අර මේවා බොහොමයක් සඳහා බලපත් ලබාදී තිබේ.

## 5.3 ඉඩම්වල භෞතික ස්වභාවය

මෙම ගම්මානය උස් කඳු ශිකර මෙන්ම තද බෑවුම්වලින්ද යුත් නිරන්තර වර්ෂාවට හසුවන පාංශු ඛාදනය දැඩිව පවතින ප්‍රදේශයකි. ගම්මානය මුළුමනින්ම කඳු බෑවුම් සහිත සුළු තැනිතලා ප්‍රදේශයකින් යුක්ත වේ. අධ්‍යයනයට පාත්‍ර වූ මෙම පර්යේෂණ බල ප්‍රදේශයෙහි පවතින කඳු සහිත තත්ත්වයම හේතු කොටගෙන ගල් සහිත පස මෙන්ම ලෝම පසින් යුක්ත ප්‍රදේශයක් බව පහත සටහන තුලින් හඳුනාගත හැකිය.

5.1 සංඛ්‍යා සටහන

ගොඩ ඉඩම්වල පවතින පසෙහි ස්වභාවය

| පසෙහි ස්වභාවය | ගෙවතු සංඛ්‍යාව | % |
|---|---|---|
| ලෝම් පස | 21 | 42.9 |
| ගල් සහිත පස | 27 | 55.1 |
| මැටි පස | 01 | 2.0 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ඉහත සටහනේ ගොඩ ඉඩම්වල පස පිළිබඳ පෙන්වා දී ඇති කරුණු අනුව 55% ක් ගල් සහිත පස මෙන්ම 43% ක්ම ලොම් පස පැවතීම ප්‍රදේශයේ කිසිදු කෘෂිකාර්මික කටයුත්තක් ක්‍රමවත්ව හෝ අක්‍රමවත්ව නොපැවතීමටද හේතු වී ඇත. මෙම ස්වාභාවික ගොඩ ඉඩම්, පාංශු ඛාදනයට ලක්වී ඇති ආකාරය පහත සංඛ්‍යා සටහන් තුළින් අවබෝධ කරගත හැක.

5.2 සංඛ්‍යා සටහන : ගොඩ ඉඩම් පාංශු ඛාදනයට ලක්වී ඇති ආකාරය

| පාංශු ඛාදනයට ලක්වී ඇති ආකාරය | ප්‍රමාණය | % |
|---|---|---|
| දැඩි ලෙස පාංශු ඛාදනය වීම | 29 | 58.7 |
| මධ්‍යස්ථ පාංශු ඛාදනය වීම | 08 | 8.4 |
| සුළු වශයෙන් පාංශු ඛාදනය වීම | 12 | 32.9 |
| එකතුව | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

කඳු සහිත ප්‍රදේශයට නිරන්තර ලැබෙන අධික වර්ෂාව මෙම පාංශු ඛාදනය සඳහා මූලිකවම හේතු වී ඇත. පාංශු ඛාදනයේ ඇති බිම් ප්‍රමාණයෙන් 59% ක් පමණම ඉතා දැඩි ලෙස ඛාදනය වී ඇති බව මේ තුළින් දැක්වේ. පාංශු ඛාදනය පිළිබඳව ඉදිරිපත් වි ඇති මතයන්ගෙන් 63න් 29 ක්ම පෙන්වා දී ඇත්තේ මෙම අධික ඛාදනය විමේ තත්ත්වයකි. පහත සංඛ්‍යා තුළින්ද පස සෝදා යාමේ අක්කර ප්‍රමාණය කෙසේදැයි යන්න ඔවුන් පෙන්වා දී ඇත.

5.3 සංඛ්‍යා සටහන : පාංශු ඛාදනය සිදුවීම

| පාංශු ඛාදනය වීම ප්‍රමාණය (අක්.) | දැඩි ලෙස ඛාදනය වීම | | මධ්‍යස්ථව ඛාදනය වීම | | සුළු ඛාදනය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| 1/4 ට අඩු | 03 | 10.3 | 0 | 0 | 0 | 0 | 03 | 6.0 |
| 1/4-1/2 | 14 | 48.3 | 6 | 75 | 11 | 73.1 | 31 | 63.2 |
| 1/2-3/4 | 5 | 17.2 | 2 | 25 | 01 | 15.4 | 08 | 16.3 |
| 3/4-1 | 2 | 6.9 | 0 | 0 | 0 | 0 | 02 | 4.2 |
| 1-1 1/2 | 3 | 10.3 | 0 | 0 | 01 | 11.5 | 04 | 2.3 |
| 1 1/2 ට වැඩි | 2 | 6.9 | 0 | 0 | 0 | 0 | 02 | 4.0 |
| එකතුව | 29 | 100 | 08 | 100 | 12 | 100 | 49 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානයේ අක්කර 1/4 - 1/2 අතර ඉඩම් ඛාදනය වීම 62% ක් පමණ වැඩි හෝ සුළු වශයෙන් දැකිය හැකිවීම තුලින් ඛාදනය වීම කෙසේද යන්න හඳුනාගත හැකිය.

ගම්මානයේ වගා නොකරන ලද ගොඩ ඉඩම් පවතින අතර එසේ වගා නොකිරීමට හේතු ලෙස පහත කරුණු ඉදිරිපත් විය.

5.4 සංඛ්‍යා සටහන : ගොඩ ඉඩම් වගා නොකිරීමට හේතු

| වගා නොකිරීමට හේතු | ප්‍රමාණය | % |
|---|---|---|
| ශ්‍රමය හිඟකම | 03 | 8.8 |
| වන සතුන්ගෙන් වන හානි | 01 | 2.9 |
| ආර්ථික ගැටලු/ආදායම් නොමැතිවීම/අස්වනු අඩුවීම | 14 | 41.2 |
| අධික පාංශු ඛාදනය | 03 | 8.8 |
| ගල් සහිත බොරලු පස | 10 | 2.9 |
| ඉඩම් නිරවුල් නොවීම | 17 | 29.4 |
| එකතුව | 48 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

මෙම ගම්මානය තුළ ගොඩ ඉඩම් මුළුමනින්ම සංවර්ධනය කර නොමැති අතර එසේ සිදු නොකිරීමට ගම්මානයේ පිහිටීම කඳු ශිකර/ගල් සහිත ඉඩම් වැනි තත්ත්වයන් හේතු වී ඇත. මඩ ඉඩම් අක්ර 01 ක් පමණක් ඇති අතර එය ද වසර ගණනාවකට වරක් පමණක් වගාකළ හැකි තත්ත්වට පත්ව තිබේ.

# හයවන පරිච්ඡේදය

# කෘෂිකර්මය හා අනෙකුත් නිෂ්පාදන කටයුතු

ගම්මානයක ජීවය බඳු කෘෂිකාර්මික අංශය මෙම ගම්මානය තුළ දක්නට නොමැතිවීම විශේෂ ලක්ෂණයක් ලෙස දැකිය හැකිය. කෙසේ වුව මෙම ගම්මානය තුළ එසේ විධිමත් හෝ අවිධිමත් ආකාරයක කෘෂි කටයුතු නොපැවතීමට හේතු රැසක් බලපා ඇති බව දැකගත හැකිය.

- ඉඩම් ප්‍රමාණවත් නොවීම (ගොඩ,මඩ)
- ගම්මානය කඳු සහිත කැළෑ බිම් මෙන්ම ගල්තලාවලින් ගහණව පැවතීම
- වර්ෂය පුරාම අධික වර්ෂාව ලැබෙන ප්‍රදේශයක් වීම
- දෛනික වැටුප් ලබන කුලී වැඩ සඳහා ජීවන රටාවකට ගැමියන් අනුගතවී සිටීම සහ රජයේ සමෘද්ධි සහනාධාර මත යැපීම

මෙවැනි විශේෂිත කරුණු සහ අනෙකුත් අවශේෂ වූ කරුණු මත ගම්මානය තුළ කෘෂිකාර්මික බෝග වගාව දැකීමට නොහැකිය.

විශේෂයෙන්ම ගම්මානයේ අනෙකුත් බෝග වගා අතර කොස් ගස් 318 ක් පැවතීම විශේෂ ලක්ෂණයකි. ඒ මත වර්ෂය පුරා කොස් ආහාරයට ගැනීමට හැකිවීම විශේෂ ලක්ෂණයකි. ඉතාමත්ම සුළු වශයෙන් තේ වගාව (තුන් හතර දෙනෙකුගේ) දැකිය හැකිය.

එසේම ගම්මානයේ සත්ත්ව පාලන කටයුතු ද දැකගැනීමට නොහැකිය. මුළු ගම්මානයටම කුකුළන් 20 දෙනෙකු හැර වෙනත් කිසිදු සතෙකු ආදායම් මාර්ගයක් ලෙස හෝ වෙනත් කරුණක් සඳහා ඇති නොකරයි. දිනකට බිත්තර 20 කට ආසන්නව සතියකට දින 02 ක් හෝ 03 ක් බිත්තර අස්වැන්නක් ගතහැකි බව ඔවුන් පවසයි. මෙම කාරණය සඳහා ප්‍රමාණවත් ඉඩකඩ මෙන්ම අවශ්‍ය දැනුම සහ ප්‍රාග්ධනය ඔවුන් සතුව නොමැත. එසේම ගෙවතු වගා ආශ්‍රිතව හෝ කෘෂිකාර්මික අංශය දියුණු කළ යුතුව ඇත.

# හත්වන පරිච්ඡේදය

# ප්‍රජා සංවිධාන සහ ජනතා සහභාගීත්වය

## 7.1 ගමෙහි ඇති ප්‍රජා සංවිධාන

ප්‍රජා සංවිධානයක් යනු ගම්මානයේ සිටින ජනතාව විසින් ඔවුන්ගේ සේවය සඳහා පිහිටුවාගත් ස්වේච්ඡාවෙන් ක්‍රියාකරන සංවිධානයකි. ගම්මානයේ පොදු අවශ්‍යතා වෙනුවෙන් ඔවුන් විසින්ම මෙම සංවිධාන පිහිටුවා ස්වේච්ඡාවෙන් ක්‍රියාත්මක කරගෙන යන අතර මෙම සංවිධානවල සාමාජිකත්වය සුළු කණ්ඩායමක් නියෝජනය කරන ඒවා මෙන්ම වැඩි සාමාජික දායකත්වයක් ඇති සංවිධාන ද පවතී. කෙසේ වුව මෙම ගම්මානයේ ප්‍රබලම ප්‍රජා සංවිධානය සමෘද්ධි සමිතිය වන අතර එහි සාමාජික පවුල් 46 ක් එනම් ගමෙන් 93% ක් නියෝජනය කරයි. මෙම සංවිධානය ජාතික මට්ටමේ සිට ක්‍රියාත්මක වන පුළුල් අරමුණු ඇති ප්‍රජා සංවිධානයක් වන අතර මෙහි සාමාජිකත්වය සමෘද්ධි සහනාධාර ලබන පවුල් සඳහා අනිවාර්යය වීම මෙහි ඇති විශේෂත්වයක් වේ. එසේම ගම්මානය තුළ ක්‍රියාත්මක වන අනෙක් ප්‍රජා සංවිධානය මරණාධාර සමිතිය වන අතර එය ආසන්න ගම්මානයන් හා ඒකාබද්ධව ක්‍රියාත්මක වේ. ක්‍රියාත්මක තත්ත්වයේ පවත්නා වෙනත් කිසිදු ප්‍රජා සංවිධාන නොමැති බව අධ්‍යයනයේදී පෙනීගිය කරුණක් විය.

## 7.2 සංවිධානවල ක්‍රියාකාරීත්වය

ගම්මානය තුළ ක්‍රියාත්මක වන සමෘද්ධි සමිතිය ක්‍රියාශීලි ප්‍රයෝජනවත් සමිතියක් ලෙස සාමාජික පවුල් 30 ක් පෙන්වා දී ඇති අතර පවුල් 03 ක් විසින් එය ප්‍රයෝජනවත් නොවන බව පෙන්වා දී ඇත. පවුල් 16 ක් කිසිවක් ඒ පිළිබඳව කිව නොහැකි බව පෙන්වා දී ඇත. කෙසේ වුව පවුල් 11 ක් මරණාධාර සමිතිය ප්‍රයෝජනවත් බව පෙන්වා දී ඇති අතර එය අවශ්‍ය නොවන බව කිසිවක් ප්‍රකාශකර නොමැත. ගම්මානයේ ප්‍රජා සංවිධානවල ක්‍රියාකාරීත්වය පිළිබඳව පහත සටහන තුළින් දැකගත හැකිය.

7.1 සංඛ්‍යා සටහන : ප්‍රජා සංවිධානවල ප්‍රයෝජනවත්භාවය

| ප්‍රජා සංවිධානය | ප්‍රයෝජනවත්බව | | එකතුව |
|---|---|---|---|
| | ප්‍රයෝජනවත් වේ | ප්‍රයෝජනවත් නොවේ | |
| සමෘද්ධි සමිතිය | 30 | 03 | 33 |
| ගොවි සංවිධානය | 04 | 01 | 05 |
| මරණාධාර සමිතිය | 11 | 0 | 11 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

මෙම ගම්මානයේ ගොවි සංවිධානයන් නියෝජනය කරන සාමාජිකයින් 05 දෙනෙකු සිටින අතර ඔවුන් වෙනත් ආසන්න ගම්මානයක ගොවි සංවිධානයක් නියෝජනය කරයි. කෙසේ වුව සමස්තයක් ලෙස ගත්කළ ගම්මානයේ සමෘද්ධි සමිතිය හැර අන් කිසිදු සමිතියක් ක්‍රියාත්මක තත්ත්වයේ නොවන බව අනාවරණය විය.

7.2 සංඛ්‍යා සටහන : ප්‍රජා සංවිධානයන්හි ක්‍රියාකාරීත්වය

| සංවිධානය | පවුල් ප්‍රමාණය | % |
|---|---|---|
| සමෘද්ධි සමිතිය | 11 | 24.4 |
| ගොවි සංවිධානය | 02 | 4.4 |
| මරණාධාර සමිතිය | 32 | 71.2 |
| එකතුව | 45 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගම්මානය තුළ වඩාත්ම ක්‍රියාකාරී සංවිධානය ලෙස 70% ක් ප්‍රකාශ කරනුයේ මරණාධාර සමිතියයි. මෙම සංවිධානය මෙසේ ක්‍රියාශීලීත්වයක් ඇතිවීමට පහත සඳහන් කරුණු හේතු වී ඇත.

7.3 සංඛ්‍යා සටහන : ප්‍රජා සංවිධාන ක්‍රියාශීලීවීමට හේතු

| ක්‍රියාශීලී වීමට හේතු | ප්‍රමාණය | % |
|---|---|---|
| පොදු වැඩවලට සහාය දීම | 28 | 62.2 |
| මාසික රැස්වීමේදී වැදගත් කරුණු සාකච්ඡා කිරීම | 01 | 2.2 |
| ණය ගනුදෙනු පහසුවීම | 02 | 4.4 |
| මරණයකදී උදව් දීම (මුදල්/භාණ්ඩ/ශ්‍රමය) | 14 | 31.1 |
| එකතුව | 45 | 100 |

මූලය : ක්ෂේත්‍ර සමීක්ෂණය – 2006, හෙ.කො.ගො.ප. හා පු. ආයතනය

ගමතුළ ක්‍රියාත්මක ප්‍රජා සංවිධාන ලෙස ප්‍රධාන වශයෙන්ම සමෘද්ධි සමිතියත් මරණාධාර සමිතියත් හඳුනාගත හැකි වූ අතර එම සංවිධාන වඩාත් ක්‍රියාශීලී වීමට ඉහත කරුණු හේතුවී ඇත. විශේෂයෙන්ම පොදු වැඩවලට සහයෝගය දීම සමෘද්ධි සමිතිය තුළින්ද, මරණයන් සිදුවූ විට ඒ සඳහා අවශ්‍ය කටයුතු කරගැනීමට සහයෝගය දීම මරණාධාර සමිතිය තුළින්ද සිදුවීම දැකිය හැකිය.

7.3 ප්‍රජා සංවිධාන මගින් කරනු ලබන සංවර්ධන කටයුතු

විශේෂයෙන්ම ගම්මානයේ ඇති ප්‍රධානම සමිතිය සමෘද්ධි සමිතිය පමණක් වන අතර අනෙක් සමිති මරණාධාර සමිතිය වේ. මේ තුළ සමෘද්ධි සමිතිය මගින් ප්‍රජා සහභාගීත්වය තුළින් සුළු වශයෙන් සිදු කරන ලද පාරවල් සැකසීම් හැර වෙනත් සැළකිය යුතු සංවර්ධන කටයුත්තක් සිදුවී නොමැත.

### 7.4 අරමුදල් ගොඩ නැගීම් සහ ණය දීම්

ගම්මානයේ පවතින ප්‍රධාන ක්‍රියාකාරී සමිතිය සමෘද්ධි සමිතිය වන අතර සමෘද්ධි බැංකු සංගමය තුළින් කුඩා කණ්ඩායම් ලෙස ණය යෝජනා ක්‍රියාත්මක වීමත් දැකිය හැකිය. මෙම ණයදීම් පිළිබඳ මෙම වර්ෂයේදීම පෙන්වා දී ඇත. මෙයට අමතරව මරණාධාර සමිතිය මගින් මරණයක් සිදු වූ විට සිදුකරන මුදල්මය ආධාර සහ ප්‍රජා සහභාගීත්ව හැර වෙනත් ණය යෝජනා ක්‍රියාත්මක නොවේ.

### 7.5 වෙනත් සේවා සැපයීම

ගම්මානය තුළ කෘෂිකාර්මික කටයුතු කිසිවක් නොකෙරෙන අතර පවතින මෙම සමිති දෙක තුළද එසේ ලබාදිය හැකි කිසිදු කෘෂි උපකරණයක් නොමැත. එසේ ලබාදීමට තරම් අවශ්‍යතාවයක්ද ගම්මානය තුළ නොමැති වීම සහ අවශ්‍ය ඉඩම් ප්‍රමාණවත්ව නොමැතිවීමද ඒ සඳහා බලපා ඇති හේතු ලෙස හඳුනාගත හැකිවිය.

### 7.6 ගමෙහි සවංර්ධන කටයුතු සඳහා ප්‍රජා සංවිධාන මගින් ජනතා සහභාගීත්වය ලබා ගැනීම

ගමතුළ පවතින ප්‍රධානතම ප්‍රජා සංවිධානය සමෘද්ධි සමිතිය වන අතර එයින් සිදුවන සංවර්ධන කටයුතු ජාතික ප්‍රතිපත්ති තුළින් ක්‍රියාත්මක වන ඒවා බැවිනුත් අවශ්‍ය ජනතා සහභාගිත්වය ලබා ගැනීම සිදු වේ. මෙම මරණාධාර සමිතිය ආසන්න ගම්මානයක එකක් වන අතර ඒ සඳහා මෙම ගමෙහි සුළු පිරිසක් නියෝජනයවීම ද දැකිය හැකිය.

### 7.7 වෙනත් ආකාරයන්ගෙන් ගමෙහි සංවර්ධනය සඳහා ජනතා සහභාගිත්වය ලබා ගැනීම

ජන්දයෙන් පත්කරන ලද නියෝජනයන් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ගැන කිසිදු තැකීමක් සිදු කොට නොමැති බව අනාවරණය විය. එසේ සිදු වූයේ නම් මෙවැනි යටිතල පහසුකම්වලින් ඉතා අවම තත්ත්වයක පසුවන පහළ ආර්ථික සමාජීය තත්ත්වයනට හිමිකම් කියන තත්ත්වයක් ගම්මානය තුළ දැකීමට සිදු නොවන්නට තිබුණි.

## සාරාංශය

නෙත් කලාපයට අයත් ප්‍රධානතම සදාහරිත වනාන්තරය වන සිංහරාජ අඩවියට මායිම්ව රත්නපුර දිස්ත්‍රික්කයේ වයඹ හා බටහිර දෙසට බරව පිහිටි මෙම ඇලපාත කොට්ඨාසය උතුරින් කුරුවිට හා කිරිඇල්ලත් නැගෙනහිරින් රත්නපුර හා පැල්මඩුල්ලත් බටහිරින් අයගමත් දකුණින් නිවිතිගලත් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට මායිම්ව පිහිටා ඇත.

රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 17 අතුරින් විශාලත්වයෙන් 15 වන ස්ථානය ගන්නා ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශාලත්වය වර්ග කිලෝ මීටර් 118.80 ක් වේ. මෙම කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 20 ක් හා ඒ තුළ ගම්මාන 80 කින් සමන්විත වේ. රත්නපුර දිස්ත්‍රික්කයේ නිරන්තර ජල ගැලීම් සහ නායයෑම්වලට මුහුණදෙන ප්‍රදේශයන් වන මෙම ඇලපාත ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ජනගහනය 39,398 කි. රත්නපුර දිස්ත්‍රික්කයේ අනෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට සාපේක්ෂව මෙම කොට්ඨාසයේ ජීවත්වන ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉතාමත් පහත් තත්ත්වයක පවතී. සංඛ්‍යා ලේඛනවලට අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ දරිද්‍රතාවයෙන් වැඩිම කොට්ඨාසය ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන අතර ලංකාවේ දුප්පත්කම වැඩිම ප්‍රදේශීය ලේකම් කොට්ඨාස අතුරින් 09 වැනි ස්ථානය එයට හිමිවේ. එහි ජීවත්වන මුළු පවුල් සංඛ්‍යාවෙන් 40.1% ක් දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින අතර එයට අයත්වන මුළු ජනගහනය 14369 කි.

ලංකාවේ දරිද්‍රතාවයෙන් ඉදිරියෙන්ම සිටින ගම්මාන තෝරා එම ගම්මාන දියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබා දෙමින් කටයුතු කරනු ලබන ගම නැගුම කඩිනම් සංවර්ධන වැඩසටහන යටතේ එක් ව්‍යාපෘති ප්‍රදේශයක් ලෙස ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි වඩාත් පහසුකම් අඩු සහ අඩු ජීවන මට්ටමකින් යුතු ජනගහනයක් සිටින කඩුවනත්තහේන්යාය ගම තෝරාගෙන ඇත.

රත්නපුර දිස්ත්‍රික්කයෙන් ඇලපාත ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ ඇලපාත නගරයේ සිට කිලෝ මීටර් 4.5 ක් පමණ දුරකින් පිහිටා ඇති මෙම ගම්මානය පලාවෙල ග්‍රාම සේවා වසමට අයත් වේ. මෙය කඳුශිකර හා තද බෑවුම් සහිත අක්කර 13.5 ක පමණ භූමි ප්‍රදේශයක පිහිටා ඇත.

මෙම ගම්මානය තුළ සිදු කරනු ලැබූ සමීක්ෂණය සඳහා තෝරා ගත් මුළු පවුල් සංඛ්‍යාව 49 කි (එය ගමෙහි ඇති සම්පූර්ණ පවුල් සංඛ්‍යාව වේ). ඒ අතර ස්ත්‍රීන් 102ක් සහ පුරුෂයින් 101 ක් ද වූ අතර මුළු ජනගහනය 203 ක් වූහ. ගමෙහි සමාජ ආර්ථික තත්ත්වය සළකන විට මුළු පවුල් සංඛ්‍යාවෙන් 93% ක්ම සමෘද්ධිලාභීන් බව පෙනී ගියේය.

මෙම ගම්මානයෙහි රජයේ ආයතන හා සම්බන්ධ රැකියා කරන කිහිපදෙනෙකු සිටින අතර ඉතා පැරණිම රජයේ සේවකයා කොන්ත්‍රාත් පදනම මත වසර 15 ක පමණ සිට මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරන්නෙකි. අනෙක් දෙදෙනා ඉතා මෑතකදී රජයේ සේවයට සම්බන්ධ වූවෝ වෙති. අනෙක් අය සඳහා ස්ථිර රැකියා නොමැති අතර ගමේ පිරිමින් ප්‍රදේශයේ සහ අවට ගම්මානවල මැණික් කර්මාන්තය ආශ්‍රිතව කුලී කම්කරුවන් ලෙසත්

කාන්තාවන් බොහොමයක් අසළ ගම්වල තේ දළු නෙළීම හා සම්බන්ධව දෛනික වැටුප් ලබන්නියන් ලෙසත් කටයුතු කරති.

ගම්මානයේ ජීවත්වන ජනතාවගේ ජලය හා සනීපාරක්ෂක පහසුකම් සළකන විට එය ඉතා අසතුටුදායක තත්ත්වයේ පවතින බව පෙනේ. වසර ගණනකට ඉහතදී ගමෙන් කොටසකට ජලය ලබාදීමට වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර තිබුනද එය ද මේවන විට අක්‍රියව පවතී. ගම්මානයේම පවතින ළිං 07කින් පවුල් 49 ටම ජල අවශ්‍යතා සපුරා ගැනීමට සිදුව ඇති අතර ඉහත ව්‍යාපෘතිය මගින් පවුල් 03 ක් පමණක් ජල අවශ්‍යතා ඉටුකර ගනී. එසේම වැසි සහිත කාලවලදී මෙම ළිං ආශ්‍රිත ජල මූලාශ්‍ර ගලායන ජල පහරට ගොදුරු වන අතර වැසි රහිත පායන කාලවලදී මෙම ළිං සම්පූර්ණයෙන්ම සිඳීයාම නිසා ජනතාව ජලය ලබා ගැනීමට අවට ගම්මානවලට යාමට සිදුව තිබේ.

වැසිකිළි පහසුකම් සැළකූවිට ද එය ද ඉතා අසතුටුදායක තත්ත්වයක පවතී. එනම් ගමේ මුළු පවුල් 49 ටම ජල මුද්‍රිත වැසිකිළි ඇත්තේ පවුල් 09 කට පමණි. පවුල් 40 ක් අවිධිමත් වැසිකිළි භාවිතයට යොමුවී ඇත.

ගම්මානයේ සම්පත් පිළිබඳ සළකා බලන විට මුළු ගමේ අක්කර 13.1/2ක භූමි ප්‍රමාණයක් පැවතීම කෘෂිකාර්මික කටයුතු සඳහා යම් තරමින් හෝ නොපෙළඹීමට හේතු වී ඇත. එම තත්ත්වය තුළ ගමෙහි එක් පවුලකට හිමිවන්නේ පර්චර් 15-20 ක් පමණ වන කුඩා කොටසක් වන බැවින් කෘෂි කර්මාන්තයේ නියැළීමට හෝ වෙනත් කටයුත්තක් සඳහා එය යොදා ගැනීමට හැකියාවක් නොලැබේ.

ගමේ බොහොමයක් ස්ථානවල කළුගල් පවතින අතර කර්මාන්තයක් ලෙස ඒ සඳහා කිසිවෙකු යොමු වී නොමැත. එසේම ගම්මානය ආශ්‍රිතව බටගස් හා වේවැල් විශාල ලෙස ව්‍යාප්ත වී ඇති අතර ඒ මගින් වට්ටි, කුඩ, කුළු වැනි දේ නිෂ්පාදනය කළ හැකිවේ. ගමෙහි රබර් වගාව සහිත ඉඩමෙහි දිය බුබුළලක් ඇති අතර නියං කාලවලදී මේ මගින් ගමේ ජනතාව ජලය ලබාගනිති. මේ තත්ත්වය හැරුනු විට මෙම ගම්මානය තුළ හඳුනා ගතහැකි වෙනත් විශේෂ සම්පත් හෝ වෙනත් විභවතාවයන් නොමැත.

ගම්මානය පිළිබඳ දේශපාලන, ආර්ථික, සමාජයීය සහ තාක්ෂණික වශයෙන් අධ්‍යයනය කිරීම තුළින් හඳුනාගත් ප්‍රධාන ගැටලු සහ අඩුපාඩු පහත පරිදි හඳුනාගත හැකි විය.

ගම නැගුම වැඩසටහන යටතේ සංවර්ධනය කරන්නට යෙදුන මෙම ගම්මානයේ මෙවන් වූ තත්ත්වයක් පවතින අතර දැනටමත් මෙම නියමු ව්‍යාපෘතියට අනුබද්ධිතව විදුලිය ලබාදීම සහ කිලෝමීටර් 01 ක් පාර සකස් කිරීම වැනි අත්‍යවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කර ක්‍රියාත්මක කරමින් පවතී. එසේම කොම්පෝස්ට් පොහොර භාවිතය, බිම්මල් වගාව වැනි පුහුණු වැඩසටහන් ද ගම්මානය තුළ හඳුන්වා දී ඇත. කෙසේ වුවද මෙම ගම්මානයේ මූලිකවම හඳනාගනු ලැබූ ගැටළු හා අවශ්‍යතා පහත දැක්වෙන පරිදි වේ.

01. ගමෙහි ප්‍රවේශ මාර්ගය සකස්කර ගැනීම
02. පානීය ජල පහසුකම් ලබාගැනීම

03. ගම්මානයට විදුලිය ලබා ගැනීම
04. ස්ථිර වැසිකිළි සාදාගැනීම
05. නිවාස සාදාගැනීම
06. ඉඩම් සඳහා බලපත් ලබාගැනීම සහ ඉඩම් නොමැති අය සඳහා ඉඩම් ලබා ගැනීම
07. විහාරස්ථානයක් සාදා ගැනීම
08. තැපැල් කාර්යාලයක් ලබා ගැනීම
09. ළදරු පාසලක් ලබා ගැනීම
10. සමුපකාරයක් ලබා ගැනීම
11. පොදු සුසාන භූමියක් ලබා ගැනීම
12. ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම
13. ප්‍රජා ශාලාවක් සාදා ගැනීම
14. ස්වයං රැකියා හඳුන්වා දීම

ඉහතදී ද සඳහන් කළ පරිදි මින් ඇතැම් සංවර්ධන කටයුතු ගම නැගුම වැඩසටහන යටතේ දැනටමත් ආරම්භ කර ඇති බැවින් අනෙකුත් සංවර්ධන අවශ්‍යතා ද එමගින් ඉටුකර ගත හැකි වෙතැයි ගම්මුන්ගේ අපේක්ෂාව වේ.